# නර්තනය

## ගුරු මාර්ගෝපදේශය

## 8 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

නර්තන
08 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය 2017
© ජාතික අධ්‍යාපන ආයතනය

**ISBN :**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් තැපෑල : **info@nie.lk**

මුද්‍රණය :

මුද්‍රණාලය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී

පර්යේෂණ වලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් ඔස්සේ නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

අධ්‍යක්ෂණය - එස්. වර්ණසිංහ අධ්‍යක්ෂ (වැ ආ),

**විෂය සම්බන්ධීකරණය** - එස්. වර්ණසිංහ අධ්‍යක්ෂ (වැ ආ),
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය**

**අභ්‍යන්තර**
- එස්. වර්ණසිංහ - අධ්‍යක්ෂ(වැ ආ),
- බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
- බී. එම්. එස්. ද සොයිසා - කථිකාචාර්ය,
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

බාහිර
- ගුණසේන රාජපක්ෂ - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික),
- කේ. සිරිල් මීගම -ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික),
ගුරු අභ්‍යාස විද්‍යාල, ගිරාගම.
- ජයන්තා හෙට්ටියවත්ත -සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
- කේ. සුසන්ත ගුණවර්ධන - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය, පිළිමතලාව.

. ඩී.එෆ්.පී.එස්.ඩී. පෙරේරා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය, කැලණිය
කේ.එල්.එම්.ජී. ධර්මලතා - ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය, දෙහිඕවිට
යූ.ප්‍රේමරත්න - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)
කලාප අධ්‍යාපන කාර්යාලය, හලාවත

**විෂය සංස්කාරක මණ්ඩලය** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක
මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක
ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07.

**භාෂා සංස්කරණය**
- මහාචාර්ය රත්න විජේතුංග (විශ්‍රාමික)
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ජයවර්ධනපුර
- ශ්‍රීනාත් ගණේවත්ත මහතා

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

නර්තන විෂය ඉගෙනීම 6 ශ්‍රේණියෙන් අරඹන ශිෂ්‍යයාට එහි ප්‍රායෝගික තත්ත්වය අනුව සතුටින් අදාළ ක්‍රියාකාරකම්හි යෙදීමට අවකාශය සලසා දීම සඳහා සැලසුම්ගත වැඩ පිළිවෙළක් සකස් වීම අත්‍යවශ්‍ය වේ. මෙහි දී ශිෂ්‍යයන්ගේ ක්‍රියාශීලීත්වය හා උද්‍යෝගය වර්ධනයට අවශ්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ශිල්ප ක්‍රමය භාවිතයට ගැනීම වැදගත් කොට සැලකිය යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කර ඇත්තේ පාඩම් ආදර්ශයක් පමණි. ශිෂ්‍යයා ජීවත් වන ප්‍රදේශය, පවතින සම්පත්, ශිෂ්‍යයන්ගේ සාධනය හා තවත් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම් සැලසුම් කර ගැනීම වැදගත් ය. පාසලේ පවතින සම්පත් මෙන් ම ගුරුවරයා විසින් ගොඩනගා ගන්නා සම්පත් ඇසුරු කර ගනිමින් වඩාත් ඵලදායි අධ්‍යාපනයක් ලබාදීම අප කාගෙත් යුතුකමකි. ඒ සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් භාවිතයට ගැනීම වැදගත් වේ. ඒ අතර තාක්ෂණික මෙවලම් භාවිත කරමින් ගුණාත්මක අත්දැකීම් ශිෂ්‍යයන් අතට පත් කිරීම කාලීන අවශ්‍යතාවක් සේ සැලකිය යුතු ය.

නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සෑම ක්‍රියාකාරමක් ආරම්භයේදී ම සුදුසු ප්‍රවේශයක් භාවිතයට ගැනීම වැදගත් ය. ශිෂ්‍යයාගේ කායික හා මානසික වර්ධනයට අවශ්‍ය පරිදි ක්‍රියාකාරකම් සැලසුම් සූදානම් කර ගන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත.
නර්තන විෂයයෙහි ස්වභාවය අනුව දැනුම,කුසලතා, ආකල්ප මෙන් ම හොඳ ජීවන පුරුදු වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සමූහයක් මෙම ගුරු මාර්ගෝපදේශයට ඇතුළත් කර ඇත. ඒවා ක්‍රමානුකූල ව සැලසුම් කර ගනිමින් ක්‍රියාත්මක කිරීම ගුරුවරයාගේ කාර්ය භාරය වේ. ඒ සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කරන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත.

- පාඩම් සැලසුම ගුරුවරයාට අවශ්‍ය පරිදි සැලසුම් කරගත හැකි මුත් ඊට අදාළ ඉගෙනුම් පල කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.
- ගුණාත්මක යෙදවුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ පාඩම ආරම්භ කිරීමට පෙර සැලසුම් කර සූදානම් කර ගත යුතු ය.
- වාර සටහනට අනුව නියමිත පාඩම් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයන්ගේ කායික හා මානසික වර්ධනයට අවශ්‍ය පරිදි පාඩම් පෙළ ගැස්වීම කළ යුතු වේ.
- ගුරු මාර්ගෝපදේශයේ දැක්වෙන පාඩම්වලට අදාළ කාලච්ඡේද ප්‍රමාණවත් පරිදි දක්වා ඇති බැවින් ඊට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සකස් කර ගැනීම වැදගත් ය.
- අදාළ ක්‍රියාකාරකමට ඇමුණුම් හා කාර්ය පත්‍රිකා සකස් කර ගැනීම කළ යුතු ය. ශිෂ්‍යයාගේ ඉගෙනුමට මග පාදන අයුරින් ඒවා සකස් කර ගත යුතු අතර, විවිධ විධික්‍රම භාවිතයට ගන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත. (චාට්, සටහන්, වගු, ප්‍රහේලිකා, පැවරුම් භූමිකා රංගන ආදිය)
- ගුරු මාර්ගෝපදේශයෙහි නිපුණතා මට්ටම් 4.2 අයත් ක්‍රියාකාරකම වාර තුනට ම විෂය අන්තර්ගතය ඇතුළත් වන පරිදි සකසා ගත යුතු ය. උදා: ජනගායනය - වාර සටහන බලන්න
- නම්‍යතා අභ්‍යාස - ක්‍රියාකාරකම් සඳහා අංග ප්‍රත්‍යංග, උපාංග වර්ධනයට අවශ්‍ය චලන භාවිතයට ගැනීම වැදගත් ය. එහි දී ශිෂ්‍යයා ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායය මෙන් ම නර්තනය කිරීමට අවශ්‍ය මූලික සංකල්ප කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. පහසුකම් ඇතොත් බෙර වාදනය හා සංගීත ඛණ්ඩයක් භාවිතයට ගත හැකි ය.
- ඇගයීම් හා තක්සේරුකරණයට අවශ්‍ය මූලික ක්‍රියාවලින් කීපයක් දක්වා ඇතත් ශිෂ්‍ය සාධනය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය ඇගයීම් උපකරණ සකස් කර ගන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත. මීට අමතර ව පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ පොත පරිශීලනය කරන්නේ නම් මැනවි.

මේ උපදෙස් සමගින් ගුණාත්මක ඉගෙනුම් ක්‍රියාවලියක් ගොඩනගමින් ගුණ නැණ බෙලෙන් යුත් ශිෂ්‍ය පරපුරක් ජාතියට උරුම කිරීමට හැකි වේවායි පතමු.

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ආයතනය දේශයේ සමස්ත දරු කැළ වෙනුවෙන් පාසල් පද්ධතිය වෙත 2015 සිට නිර්දේශ කරන ලද නව විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි දෙවන පියවර 2016හි ක්‍රියාවට නැංවේ. ඒ අනුව මෙම වසරේ 7 සහ 11 ශ්‍රේණි සඳහා වූ නව විෂය නිර්දේශයන් නව්‍යකරණයන් සහිත ව හඳුන්වා දෙමින්, එහි ක්‍රියාත්මක භූමිකාව රඟන ගුරුවරයාට නිසි මඟපෙන්වීම් ලබා දීම පිණිස මෙම ගුරු මාර්ගෝදේශය සකස් කොට ඇත.

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව වසර 8කට වරක් එළැඹෙන මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විසින් ජාතික අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා පාසල් පද්ධතියට ඒ ඒ විෂයයන් සඳහා නව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම ශිල්ප, සංකල්ප හඳුන්වා දෙනු ලබන අතර, සෞන්දර්ය විෂයයන්හි මෙතෙක් නිර්දේශිත ගී, කවි, කතා, සංස්කෘතිකමය කරුණු, තේමා, සම්ප්‍රදායන්හි විවිධත්ව, ඈ සම කාලීන අවශ්‍යතා මත නව දේශීය දර්ශනයට අනුකූල ව අනාගතයට ගැළපෙන පරිදි ඉදිරිපත් කර ඇත.

අප විසින් විෂයමාලා සැලසුම්කරණයේ දී පළමුකොට ම හඳුනා ගන්නා ලද 6-13 දක්වා පුළුල් වූ විෂය සන්ධාරය (Curriculum Grid) නිපුණතා හා නිපුණතා මට්ටම් ලෙස දරුවාගේ වර්ධන හා චින්තන අවධීන්ට අනුව ක්‍රමික ව පෙළගස්වා ඇත. ඒ අනුව 6 හා 10 ශ්‍රේණි සඳහා නිර්දේශිත විෂය කරුණු සමඟ අවියෝජනීය සබඳතාවක් මෙන් ම ක්‍රමික වර්ධනයක් සිදු වන පරිදි 8 ශ්‍රේණි විෂය නිර්දේශ සැලසුම් කොට ඊට අනුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශය රචනා කොට ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය හරහා විෂය නිර්දේශයන්හි නාමික ව දක්වා ඇති විෂය කරුණුවල සීමා නිර්ණයන් නිවැරැදි ව තෝරා බේරා ගැනීම, දරුවා තුළ සංකල්ප සාධනයෙහි ලා විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අනුපිළිවෙළ හඳුනා ගැනීම, පාඩම දරුවාට පිළිගැන්වීමෙහි ලා යෝජිත සුවිශේෂ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම යන ශක්‍යතා ප්‍රමාණාත්මක ව ගුරු ඔබ වෙත ලැබෙනු ඇත.

අප විෂයමාලා කමිටුව විසින් රචිත මෙම පොත පරිහරණය කරමින් ඔබ, විෂයය කරුණුවල අවශ්‍ය මූලික දැනුම අත්පත් කර ගත්ත ද, යෝජිත විෂය කරුණුවල සමාජ භාවිතාව පිළිබඳ ඔබගේ අවදිමත් භාවය වැදගත් ය. ඒ සඳහා විෂය භේදයකින් තොර ව සංගීත කෘතිවලට සවන්දීම, නර්තන, නාට්‍ය ප්‍රසංග හා චිත්‍රපට නැරඹීම, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම ආදිය ඉතා හොඳ ප්‍රබෝධමත් බවක් හා පෙළඹවීමක් ඔබ තුළ ජනිත කරනු ඇත.

ඒ අනුව ගුරු මාර්ගෝපදේශය ද, උදව් අත්පොත ද ඒවායේ ඇතුළත් පණිවිඩ, හැඳින්වීම් ඇතුළු සියල්ල සහිත ව පූර්ණ වශයෙන් ම කියවන්න. ඉන් ගුරුවරයකු ලෙස ඔබ සතු විය යුතු අත්‍යවශ්‍ය ගුණයක් වූ ''කියවීමේ පුරුද්ද'' ඔබට ලැබ ගන්නට හැකි වනු ඇත.

මේ සියලු ව්‍යායාමයන්හි, කර්තව්‍යයන්හි අග්‍ර ඵලය අපගේ දරු පරපුර වෙත ලබා දෙන්නට ඔබගේ ගුරු භූමිකාව ශක්තිමත් වේවා! යන්න මාගේ ඒකායන පැතුමයි.

ශාස්ත්‍රපති සුදත් සමරසිංහ,
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ)**
ගුරු පුහුණු හා ආයතනික සංවර්ධන
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

# පටුන

පිටුව

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| හැඳින්වීම | v |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | vi - x |
| විෂය නිර්දේශය | xi - xvii |
| වාර සටහන | xviii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 43 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යූහයන් හි ක්‍රියාවලීන් දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය මඟින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගනු ලැබ ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කර ගනු ලැබ ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකේය බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හා සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩනැඟීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර, ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. අන්තර්ජාතික ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත වූ ආකල්ප හා කුසලතා, පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

**1. සන්නිවේදන නිපුණතා :**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

**2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයෝ
- චිත්තවේගී බුද්ධිය

**3. පරිසරයට අදාළ නිපුණතා :**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයෝ, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීව ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මල බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපාය යක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ඒවායේ ශක්‍යතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම යට සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමත් ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

## නර්තන විෂය අරමුණු

- පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් නිමාවකින් යුත් කලාකෘති බිහි කිරීම මෙන් ම ජීවිතයේ දී මුහුණ පාන විවිධ ගැටලු නිර්මාණශීලී ව විසඳා ගැනීම සඳහා අවශ්‍ය චින්තනය හා නිර්මාණ කුසලතා ප්‍රවර්ධනය කිරීම.

- නර්තන විෂයය හා බැඳි ක්‍රියාකාරකම් මඟින් අනාගත වැඩ ලෝකයට මුහුණ දිය හැකි ක්‍රියාකාරිත්වය මෙන් ම සමාජයෙහි උසස් ජීවන තත්ත්වයක් ගොඩ නඟාගැනීම සඳහා අවශ්‍ය සමාජීය හා පෞද්ගලික ශක්‍යතා වර්ධනය කිරීම.

- සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන වැඩසටහන් අතරින් හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය විචාර ශක්ති වර්ධනය, රසඥතා වර්ධනය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ලබාදීම.

- දේශීය, විදේශීය නර්තන හා සබැඳි සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය මඟින් විවිධ සංස්කෘති අගය කිරීම මෙන් ම අන්තර්ජාතික තලයේ සමාජයේ දී දේශීය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය උදාර හැඟීම්, ආකල්ප සංවර්ධනය කිරීම.

- නර්තන විෂයය හා බැඳි සංස්කෘතික පසුබිම හා සෙසු සංස්කෘති සතු හරයන් හඳුනා ගනිමින් පුද්ගල අභිමානයට ගරු කරන මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.

- සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය සඳහා නර්තන විෂයය හා සබැඳි ක්‍රියාකාරකම් භාවිතයට ගැනීමේ හැකියාව සංවර්ධනය කිරීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 ස්වාභාවික පරිසරයෙන් හඳුනාගත් සත්ත්ව චර්යා ඇසුරෙන් නර්තන නිර්මාණ කරයි. | ♦ විවිධ සතුන්ගේ චර්යා ලක්ෂණ හඳුනා ගැනීම.<br>• අලියා, සිංහයා, අශ්වයා, මොනරා, කුකුළා, උකුස්සා,<br>♦ නම් කරන ලද සතුන්ගේ විවිධ ඉරියවු ඇසුරින් චලන නිර්මාණය<br>♦ එම චලන ඇසුරින් නර්තන නිර්මාණ | ♦ සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණ නම් කරයි.<br>• සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණවල විවිධත්වය ප්‍රකාශ කරයි.<br>• සතුනයන්ගේ චර්යා ලක්ෂණ ඇසුරෙන් චලන නිර්මාණය කරයි.<br>• උචිත චලන භාවිත කරමින් නර්තන නිර්මාණ කරයි.<br>• තාල රිද්ම අනුගමනය කරමින් නර්තන නිර්මාණ කරයි. | 06 |
| | 1.2 භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි. | ♦ භය නමැති ස්ථායී භාවය හා සබැඳි අවස්ථා<br>♦ භය නමැති ස්ථායී භාවයෙහි සුවිශේෂ ලක්ෂණ<br>♦ භය නමැති ස්ථායී භාවය ඉස්මතු වන පරිදි සිද්ධියක් ගොඩ නැඟීම.<br>♦ සිද්ධියට අනුව චරිත නිරූපණය | ♦ භය නමැති ස්ථායී භාවය ඉස්මතු වන අවස්ථා නම් කරයි.<br>♦ එහි සුවිශේෂ ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>♦ භාවයට අදාළ සිද්ධියක් ගොඩනගයි.<br>♦ භාවය ප්‍රකාශ වන පරිදි සිද්ධියක් අනුව චරිත නිරූපණය කරයි.<br>♦ ඉදිරිපත් කරන ලද චරිත නිරූපණ අගය කරමින් අදහස් දක්වයි. | 04 |
| | 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | ♦ සවරම්/පතුරු නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ<br>• උපකරණ භාවිතයේ නිවැරදි විධික්‍රම<br>• උචිත සරල පද<br>• ගායනය සහිත ව නර්තනය<br>• සාමූහික ව නර්තනය<br>♦ නර්තන නිර්මාණය | ♦ සවරම් /පතුරු නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ නම් කරයි.<br>♦ උපකරණ නිවැරදි ව භාවිත කරයි.<br>♦ නර්තනයේ දී අවකාශය උචිත පරිදි භාවිත කරයි.<br>♦ සාමූහික ව ඉදිරිපත් කරන ලද නර්තන අංග අගයමින් අදහස් ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 ශාරීරික නම්‍යතාව සඳහා අභ්‍යාස ඉදිරිපත් කරයි. | ♦ නම්‍යතා අභ්‍යාස හතරක් | ♦ නම්‍යතා අභ්‍යාස කිරීමේ දී නිවැරදි විධික්‍රම අනුගමනය කරයි.<br>♦ අංග, ප්‍රත්‍යංග, උපාංග, නිවැරදි ව හසුරුවයි.<br>♦ ඒකල හා සාමූහික වශයෙන් නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි. | 02 |
| | 2.2 පාද නිවැරදි ව හැසිරවීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි. | ♦ පා සරඹ /මණ්ඩිපද 1- 9 තෙක් හමාර පදය සමඟින් | ♦ පා සරඹ /මණ්ඩිපද තාල තබමින් කියයි.<br>♦ නිවැරදි අංගහාර හා ඉරියවු අනුගමනය කරමින් පා සරඹ /මණ්ඩිපද ඉදිරිපත් කරයි.<br>♦ 1 - 9 තෙක් පා සරඹ /මණ්ඩිපද සාමූහික ව ඉදිරිපත් කරයි. | 06 |
| | 2.3 නර්තන හා සබැඳි විධික්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි. | ♦ ගොඩසරඹ /ඉලංගම් සරඹ/ දොඹින පද 1- 6 තෙක්<br>♦ කස්තිරම/ඉරට්ටිය/හමාර පදය සමඟින් විලම්බ, මධ්‍ය, ලයට | ♦ සරඹ පද විලම්බ, මධ්‍ය, ලයට තාල තබමින් කියයි.<br>♦ කස්තිරම, ඉරට්ටිය, හමාර පදය, තාල තබමින් කියයි.<br>♦ විධික්‍රම අනුගමනය කරමින් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි.<br>♦ විලම්භ, මධ්‍ය, ලයට අනුව සරඹ අභ්‍යාස කරයි.<br>♦ බෙර වාදනයට අනුව නිවැරදි ව සරඹ ඉදිරිපත් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අලංකාර මාත්‍රා නිර්මාණය කරයි. | ♦ උඩරට/පහතරට/සබරගමු සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අලංකාර මාත්‍රා දෙකක් නිර්මාණය (මැදුම් තනි තිතට) | ♦ අලංකාර මාත්‍රා සඳහා සුදුසු චලන නිර්මාණය කරයි.<br>♦ අදාළ තිතට අනුව අලංකාර මාත්‍රා ඉදිරිපත් කරයි.<br>♦ නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රා වෙනත් අවස්ථා සඳහා භාවිතයට ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>♦ සාමූහික ව බෙර වාදනයට අලංකාර මාත්‍රා නර්තනය කරයි. | 03 |
| | 2.5 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | ♦ 7 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද වන්නම සම්පූර්ණයෙන්<br>♦ වෛරොඩි /ඊශ්වර කුණ්ඩතාලය /කදම්බ පක්ෂි වන්නම කස්තිරම/ඉරට්ටිය/කලාසම සමගින් | ♦ 7 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.<br>♦ අදාළ තිත් රූපයට අනුව වන්නමේ පද නර්තනය කරයි.<br>♦ නිවැරදි අංගහාර අනුගමනය කරමින් නර්තනය කරයි<br>♦ කස්තිරම/ඉරට්ටිය/කලාසම තාල තබමින් කියයි.<br>♦ නිවැරදි තාල රූපයට කස්තිරම /ඉරට්ටිය /කලාසම ඉදිරිපත් කරයි. | 06 |
| | 2.6 විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | ♦ සුළු මහ දෙතිතේ තාලයට බෙරපද/දවුල් පද<br>♦ ඉගෙන ගන්නා ලද වන්නම්වල අදාළ කොටස්<br>♦ සිරස පාද, සවරම් සහ පතුරු කවි ප්‍රස්තාරකරණය | ♦ සුළු මහ දෙතිතේ තාලයට බෙරපද/දවුල් පද ප්‍රස්තාර කරයි.<br>♦ මැදුම් තනිතිතේ තාලයට අදාළ වන්නම්වල බෙර පදය සිට කස්තිරම/ඉරට්ටිය/කලාසම තෙක් ප්‍රස්තාර කරයි.<br>♦ අදාළ කවි ප්‍රස්තාර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | ♦ පහතරට බෙරය හැඳින්වීම<br>• වාදන අවස්ථා<br>• ව්‍යුහය<br>• යොදා ගන්නා අමුද්‍රව්‍ය | ♦ පහතරට බෙරය වාදනය කරන අවස්ථා නම් කරයි.<br>♦ යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරයි.<br>♦ ව්‍යුහය හා සැකැස්ම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>♦ නියමිත පරිමාණයට අනුව රූප සටහනක් ඇඳ කොටස් නම් කරයි. | 02 |
| | 3.2 විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | ♦ සතර බීජාක්ෂර<br>♦ සුළු තනි තිතට අනුව බෙර පද වාදනය<br>(ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාළව) | ♦ සතර බීජාක්ෂර වාදනය කරන අයුරු විස්තර කරයි.<br>♦ සතර බීජාක්ෂර වාදනය කරයි.<br>♦ සුළු තනිතිතට අයත් බෙර පද නම් කරයි.<br>♦ සුළු තනිතිතට බෙර පද වාදනය කරයි.<br>♦ සාමූහික ව බෙරපද වාදනය කරයි. | 04 |
| 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 නිර්දේශිත ගායනවල සමාජයීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | ♦ සිරසපාද, සවරම්/පතුරු, වන්නම් ගායනවල සංස්කෘතික පසුබිම ගායනාවල සුවිශේෂ ලක්ෂණ | ♦ අදාළ ගායනය භාවිතයට ගන්නා අවස්ථා නම් කරයි.<br>♦ ගායනවල සමාජයීය,සංස්කෘතික පසුබිම විස්තර කරයි.<br>♦ අදාළ කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කරයි. | 03 |
| | 4.2 නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි. | ♦ සිරසපාද, සවරම්, පතුරු, වන්නම්<br>♦ නියමිත නාදමාලාව අනුව ගායනය<br>♦ නියමිත තිත්රූපයට අනුව ගායනය<br>♦ නිවැරදි වචන උච්චාරණය | ♦ ගායනවලට අදාළ තිත්රූප නම් කරයි.<br>♦ නියමිත නාදමාලාවට අනුව ගායනය කරයි.<br>♦ බෙර වාදනයට අනුව තාල තබමින් ගායන ඉදිරිපත් කරයි.<br>♦ ඒකීය හඬතලයක පිහිටා ගායන ඉදිරිපත් කරයි.<br>♦ සාමූහික ව ගායන ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි. | ♦ මූලාශ්‍රය- රූකම්<br>• ගල් කැටයම්<br>• ලී කැටයම්<br>• සිතුවම්<br>• මූර්ති | ♦ රූකම් වර්ග කර දක්වයි.<br>♦ රූකම් දක්නට ලැබෙන ස්ථාන නම් කරයි.<br>♦ නර්තන පැවති බවට රූකම්, ඇසුරෙන් සාධක ඉදිරිපත් කරයි.<br>♦ සමාජීය හා ආගමික අවශ්‍යතා සඳහා නර්තනය භාවිතයට ගත් බවට තොරතුරු ඉදිරිපත් කරයි.<br>♦ රූකම් ආරක්ෂා කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | 02 |
| | 5.2 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි. | ♦ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායය හැර වෙනත් නර්තන සම්ප්‍රදායය කට අයත් ශාන්තිකර්මයක තොරතුරු<br>උඩරට - කොහොඹායක් කංකාරිය<br>පහතරට - දෙවොල් මඩුව<br>සබරගමු - පහන් මඩුව<br>පුරාවෘත්ත කතාව, පැවැත්වීමට හේතු, පුද ලබන දෙවිවරු සහ යක්කු , නර්තන, ගායන, වාදන, චාරිත්‍ර රංග භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ | ♦ අදාළ ශාන්තිකර්මය පැවැත්වීමට හේතු දක්වයි.<br>♦ පුරාවෘත්ත (කතාව) විස්තර කරයි.<br>♦ පුද ලබන දෙවිවරුන් /යකුන් නම් කරයි.<br>♦ අදාළ ශාන්තිකර්මයේ අන්තර්ගත ගායන, වාදන, නර්තන, රංග වස්ත්‍රාභරණ රංග භාණ්ඩ, චාරිත්‍රවිධි හා සැරසිලි නම් කරයි.<br>♦ ශාන්තිකර්ම පැවැත්වීමේ දී සාමූහික ව කටයුතු කිරීම පිළිබඳ ව අගයමින් අදහස් දක්වයි. | 04 |
| | 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | ♦ එස්.පණීභාරත<br>කේ.එස්.ප්‍රනාන්දු<br>ගලුකාගම හීන්නිලමේ<br>• ජීවන තොරතුරු<br>• නර්තන ප්‍රවර්ධනයට දායකත්වය | ♦ නර්තන ශිල්පීන්ගේ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.<br>♦ නර්තනයේ ප්‍රවර්ධනයට දායක වී ඇති අයුරු විස්තර කරයි.<br>♦ සේවය අගයමින් අදහස් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1 පෙරහර හා සබැඳි පසුබිම අධ්‍යයනය කරමින් සුවිශේෂ ලක්ෂණ විචාරය කරයි. | ♦ දළදා පෙරහර පැවැත්වීමට හේතු<br>• පැවැත්වෙන කාලසීමාව<br>• පෙරහර හා සබැඳි චාරිත්‍ර, නර්තන, ගායන, වාදන, සැරසිලි සහ රංගවස්ත්‍රාභරණ | ♦පෙරහර හා සබැඳි පසුබිම විස්තර කරයි.<br>♦පෙරහර පැවැත්වීමේ හේතු විස්තර කරයි.<br>♦ පෙරහර පැවැත්වෙන කාල සීමාව නම් කරයි.<br>♦ පෙරහර හා සබැඳි චාරිත්‍ර නර්තන, ගායන, වාදන, සැරසිලි හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>♦ පෙරහරෙහි ආගමික හා සංස්කෘතික වටිනාකම් අගයමින් අදහස් දක්වයි. | 03 |
| | 6.2 වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි. | භරත නාට්‍යම් සම්ප්‍රදායය<br>♦ ප්‍රචලිත ප්‍රදේශ<br>♦ ආගමික පසුබිම හා විකාශනය<br>♦ සංගීත සම්ප්‍රදායය<br>♦ වාද්‍ය භාණ්ඩ, නර්තන අංග සහ රංගවස්ත්‍රාභරණ<br>♦ උගන්වනු ලබන ආයතන | ♦ ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>♦ ආගමික පසුබිම විස්තර කරයි.<br>♦ සංගීත සම්ප්‍රදායය හා වාද්‍ය භාණ්ඩ නම් කරයි.<br>♦ නර්තනය උගන්වන ආයතන නම් කරයි.<br>♦ නර්තන අංග සහ රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව අදහස් දක්වයි. | 04 |
| | 6.3 විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | නවරාත්‍රි උත්සවය පැවැත්වීමට හේතු<br>♦ ආගමික සම්බන්ධතාව<br>♦ චාරිත්‍ර විධි<br>♦ නර්තන, ගායන, වාදන, සැරසිලි | ♦ නවරාත්‍රි උත්සවය හා සබැඳි ආගමික පසුබිම විස්තර කරයි.<br>♦ පැවැත්වීමට හේතු සහ ආගමික සම්බන්ධතාව විස්තර කරයි.<br>♦ චාරිත්‍ර විධි නම් කරයි.<br>♦ උත්සවය හා සබැඳි නර්තන, ගායන, වාදන සහ සැරසිලි පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි.<br>♦ සංස්කෘතික වටිනාකම් අගයමින් අදහස් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.1 නිර්දේශිත ගීතයට සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි. | දීකිරි දීකිරි/රත්නදීප ජන්ම භූමි<br>♦ පද රචනය හා භාෂාව<br>♦ සංගීතය<br>♦ ගායනය<br>♦ ගීතයේ අර්ථය | ♦ ගීත පද රචනය, සංගීතය, ගායන ශිල්පීන් නම් කරයි.<br>♦ පද රචනයේ දී භාෂාව හසුරුවා ගෙන ඇති අයුරු විස්තර කරයි.<br>♦ ගීතයේ කලාත්මක පසුබිම පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරයි. | 02 |
| | 7.2 ගීතයට අනුව නර්තන නිර්මාණ කරයි. | දීකිරි දීකිරි/රත්නදීප ජන්ම භූමි<br>♦ ගීතයට උචිත චලන නිර්මාණය<br>♦ ගීතයට අනුව නර්තන නිර්මාණය<br>♦ අවකාශ භාවිතය | ♦ ගීතයට උචිත චලන යොදා ගනිමින් නර්තන නිර්මාණ කරයි.<br>♦ ඒකල හා සාමූහික වශයෙන් නර්තන නිර්මාණ කරයි.<br>♦ අවකාශය නිසි ලෙස යොදා ගනිමින් නිමාවක් සහිත නර්තන ඉදිරිපත් කරයි.<br>♦ ඉදිරිපත් කරන ලද නර්තන අංග පිළිබඳ ව අගයමින් අදහස් ප්‍රකාශ කරයි. | 04 |
| | 7.3 සරල සැරසිලි අංගයක් නිර්මාණය කරයි. | සරල සැරසිලි අංගයක් නිර්මාණය<br>♦ ගොප් ගෙඩිය | ♦ ගොප් ගෙඩිය භාවිතයට ගන්නා අවස්ථා නම් කරයි.<br>♦ සැරසිලි අංගය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය නම් කරයි.<br>♦ සැරසිලි අංගය නිර්මාණය සඳහා නිවැරදි ශිල්ප ක්‍රම භාවිතයට ගනියි.<br>♦ ගොප් ගෙඩියට උචිත කැටයම් නිර්මාණය කරයි.<br>♦ සකස් කරන ලද නිර්මාණ අගයමින් අදහස් ප්‍රකාශ කරයි. | 06 |
| | | | | 84 |

## ක්‍රියාකාරකම් බෙදා දැක්වීම

| ක්‍රියාකාරකම් අංක | I වාරය | කාලච්ඡේද |
|---|---|---|
| 2.1 | නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරමු | 02 |
| 2.1.1 | නර්තන මාධ්‍යයෙන් සත්ත්ව චරිත නිරූපණය කරමු | 06 |
| 2.2 | නර්තනයට පාද හුරු කර ගනිමු | 06 |
| 2.3 | නර්තනයට හස්ත හා පාද හුරු කර ගනිමු | 04 |
| 2.4 | බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ | 03 |
| 4.1 | ජන ගායනවල පසුබිම හඳුනා ගනිමු | 03 |
| 4.2 | ජන කවි ගායනය කරමු (වන්නම්) | 02 |
| 2.5.1 | වන්නම් ගයමින් නටමු | 02 |
| | | 28 |
| | II වාරය | |
| 1.3.1- 1.3.2 | පතුරු / සවරම් නැටුම නිර්මාණය කරමු | 06 |
| 3.1 | පහතරට බෙරය පිළිබඳ තොරතුරු රැස් කරමු | 02 |
| 3.2 | සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය කරමු | 04 |
| 4.2 | ජන ගී ගායන ඉදිරිපත් කරමු | 02 |
| 2.5.2 | වන්නම් ගයමින් නටමු | 04 |
| 5.1 | නර්තන කලාව හා සබැඳි මූලාශ්‍රය හඳුනා ගනිමු | 02 |
| 6.3 | නවරාත්‍රි උත්සවය හඳුනා ගනිමු | 02 |
| 7.3 | ගොප් ගෙඩියක් නිර්මාණය කරමු | 06 |
| 2.6.1 | අදාළ කොටස් ප්‍රස්තාර කරමු | 01 |
| | | 29 |
| | III වාරය | |
| 1.2 | භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරමු | 04 |
| 4.2 | ජන ගී ගායනා ඉදිරිපත් කරමු | 02 |
| 2.6.2 | නිර්දේශිත කවි හා පද ප්‍රස්තාර කරමු | 02 |
| 5.2 | ශාන්තිකර්ම හඳුනා ගනිමු | 04 |
| 5.3 | නර්තන ශිල්පීන් අගයමු | 02 |
| 6.1 | මහනුවර දළදා පෙරහැර හා එහි අසිරිය | 03 |
| 6.2 | භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායය හඳුනා ගනිමු | 04 |
| 7.1 | ගීතයේ පසුබිම හඳුනා ගනිමු | 02 |
| 7.2 | ගීතයට අනුව නර්තන නිර්මාණය කරමු | 04 |
| | | 27 |
| | | 84 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

| | | |
|---|---|---|
| **නිපුණතාව 1.0** | : | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. |
| **නිපුණතා මට්ටම 1.1** | : | ස්වාභාවික පරිසරයෙන් හඳුනාගත් සත්ත්ව චර්යා ඇසුරෙන් නර්තන නිර්මාණ කරයි. |
| **ක්‍රියාකාරකම 1.1** | : | "නර්තන මාධ්‍යයෙන් විවිධ සත්ත්ව චරිත නිරූපණය කරමු." |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 06 |
| **ඉගෙනුම් පල** | : | • අලියා, සිංහයා, අශ්වයා, මොනරා, කුකුළා, උකුස්සා යන සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණ නම් කරයි.<br>• සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණවල විවිධත්වය පිළිබඳ අදහස් දක්වයි.<br>• එම චර්යා ලක්ෂණ ඇසුරු කරගනිමින් චලන නිර්මාණය කරයි.<br>• උචිත චලන භාවිත කරමින් නර්තන නිර්මාණය කරයි.<br>• නිරීක්ෂණය කරන ලද චලනවලට උචිත පරිදි තාල, රිද්ම අනුගමනය කරමින් නර්තන නිර්මාණය කරයි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | නම් කරන ලද සත්ත්ව රූප ඇතුළත් පින්තූර, නර්තන නිර්මාණ කිරීමට උචිත සංගීත ඛණ්ඩ ඇතුළත් සංයුක්ත තැටි (CD) හා දෘශ්‍ය සංයුක්ත තැටි (VCD) |
| **ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** | : | නම් කරන ලද සතුන්ගේ පින්තූර රැගෙන ඒමට සිසුන් පෙර දිනයක දී දැනුම්වත් කරන්න. |

| | | |
|---|---|---|
| පියවර 1 | • | ස්වාභාවික පරිසරයේ දී දක්නට ලැබෙන සතුන්ගේ හැසිරීම් රටා පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම හා ඒ ඒ සත්ත්වයන්ට ආවේණික ලක්ෂණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. |
| පියවර 2 | • | සත්ත්වයන්ගේ චරිතවල විවිධත්වයන්, ආවේණික ලක්ෂණ ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ සත්ත්ව චරිත සඳහා සුවිශේෂ චලන නිර්මාණය කිරීමට මඟ පෙන්වීම. |
| පියවර 3 | • | අලියා, සිංහයා, අශ්වයා, මොනරා, කුකුළා, උකුස්සා යන සතුන්ගේ චර්යාමය ලක්ෂණ පිළිබඳ ව දැනුම්වත් කිරීම, උචිත චලන නිර්මාණයට යොමු කිරීම. එහි දී ඒ ඒ සත්ත්වයාගේ විවිධත්වය දැක්වීමේ දී සිරුරේ කොටස් (අංග, ප්‍රත්‍යංග, උපාංග) මූලික කර ගැනීමට උපදෙස් දීම. (උදා: මොනරා බෙල්ල හැසිරවීම, පිල්විදහා රවුමට කැරකීමේ දී අත්, පා චලන) එක් එක් සත්ත්වයාගේ සුවිශේෂ බව සාකච්ඡා කිරීමෙන් චලන නිර්මාණයට යොමු කිරීම. |
| පියවර 4 | • | නිර්මාණය කරන ලද චලන සඳහා උචිත පරිදි තාල හා රිද්ම භාවිත කරමින් නර්තන නිර්මාණය කිරීමට අවස්ථාව සලසා දීම. |
| පියවර 5 | • | පන්තියේ සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් වශයෙන් හෝ තනි ව තම නිර්මාණ ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. |
| පියවර 6 | • | එම නිර්මාණ අගයමින් එය තව දුරටත් සංවර්ධන ය කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ඉදිරිපත් කරන නර්තන නිර්මාණ පිළිබඳ ව සිසු අදහස් විමසන්න. (භාව ප්‍රකාශනය, උචිත චලන යොදා ගැනීම, අවකාශ භාවිතය)
- එක් එක් සත්ත්වයාට ආවේණික වූ චර්යා ලක්ෂණ පිළිබඳ ව අදහස් විමසන්න.
- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව හෝ තනි ව හෝ සත්ත්ව චරිත ඇසුරෙන් නර්තන ඉදිරිපත් කිරීමට යොමු කර ඇගයීමක් කරන්න. (ඉහත නම් කරන ලද සත්ත්ව චරිත ඇසුරෙන්)

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 1.0** | : | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. |
| **නිපුණතා මට්ටම 1.2** | : | භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි. |
| **ක්‍රියාකාරකම 1.2** | : | ''භය'' නමැති ස්ථායී භාවය හා සබැඳි අවස්ථා නිරූපණය කරමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 04 යි |

**ඉගෙනුම් පල** :

- 'භය' නමැති ස්ථායී භාවය ඉස්මතු වන අවස්ථා නම් කරයි.
- එහි සුවිශේෂ ලක්ෂණ ප්‍රකාශ කරයි.
- භාවයට අදාළ අවස්ථා ඇති සිද්ධියක් ගොඩනගයි
- භාවය ප්‍රකාශ වන පරිදි සිද්ධියක් අනුව චරිත නිරූපණය කරයි.
- ඉදිරිපත් කරන ලද චරිත නිරූපණ අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය පට, පින්තූර, පහතරට වෙස්මුහුණු, 'භය' නමැති ස්ථායී භාව රඟ දැක්වීමට සුදුසු සංගීත ඛණ්ඩ ඇතුළත් සංයුක්ත තැටි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

පියවර 1
- 'භය' ප්‍රකාශ වන විවිධ අවස්ථා දැක්වෙන පින්තූර ප්‍රදර්ශනය කිරීම.

පියවර 2
- 'භය' නමැති ස්ථායිභාවය ඉස්මතු කර දැක්විය හැකි අවස්ථා පිළිබඳ අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 3
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව හෝ අවස්ථා නිරූපණය කිරීමට අදාළ මාතෘකා බෙදා දී සාකච්ඡා කර නිර්මාණය කිරීමට යොමු කිරීම.

උදා:
- කනත්ත අසලින් යන විට පන්දම නිවීම හා සුදු ඇඳගත් රුවක් දැකීම.
- කහ ඉර හරහා පාර මාරු වීමේ දී හදිසියේ වාහනයක් තිරිංග තද කර තමා ආසන්නයට ම පැමිණ නතර කිරීම.
- මධ්‍යම රාත්‍රියේ සොරුන් කණ්ඩායමක් නිවසට ඇතුළුවීම.

පියවර 4
- එක් කණ්ඩායමක් අවස්ථා නිරූපණය ඉදිරිපත් කරන විට සෙසු කණ්ඩායම් එය නිරීක්ෂණය කිරීමට යොමු කිරීම.

පියවර 5
- නරඹන ලද නිර්මාණ පිළිබඳ ව විමසීම හා ඒවා සංවර්ධනය සඳහා උපදෙස් ලබාදීම.

පියවර 6
- ඉදිරිපත් කරන ලද නර්තන නිර්මාණ පිළිබඳ සාකච්ඡාවෙන් අනතුරු ව වාදනයට හෝ යොදාගත් සංගීත ඛණ්ඩවලට හෝ අනුව නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලැස්වීම හා සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය**

**සඳහා උපදෙස්** : කාර්ය පත්‍රිකාවේ සඳහන් පරිදි සිද්ධිය අධ්‍යයනය කොට නර්තන නිර්මාණයට යොමු කරන්න.

- 'භය' නමැති ස්ථායීභාවය දැක්වෙන පින්තූර රැස්කර කෙටි විස්තරයක් සහිත පොත් පිංචක් සකස් කිරීමට යොමු කරන්න.

- 'භය' නමැති ස්ථායී භාවය මතුවන පරිදි සිද්ධියට උචිත සිදුවීම්, අවස්ථා, චරිත ස්වභාව ඉස්මතු වන පරිදි නර්තන නිර්මාණය සඳහා උපදෙස් ලබාදෙන්න.

සැ.යු: සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.3** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.3.1** : පතුරු නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- පතුරු නැටුම, ගැමි නැටුම් විශේෂයක් බව ප්‍රකාශ කරයි.
- විනෝදාස්වාදය සඳහා පතුරු නැටුම යොදාගන්නා බවට කරුණු ඉදිරිපත් කරයි.
- පෙරහර නර්තන අංග අතර පතුරු නැටුම සුවිශේෂ බවට කරුණු දක්වයි.
- පතුරු නැටුමේ දී භාවිත කරන උපකරණය සකස් කර ගන්නා අයුරු විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පතුරු නැටුම භාවිත කරන උපකරණය/පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

සැ.යු. : පතුරු නැටුම හා සම්බන්ධ කවියක් ශ්‍රවණයට සැලැස්වීම

පියවර 1
- පතුරු නැටුම පිළිබඳ පහත සඳහන් කරුණු මතු වන සේ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවීම.
- පතුරු නැටුම ගැමි නැටුම් විශේෂයක් වීම.
- මෙම ගැමි නැටුමෙන් විනෝදාස්වාදය ලැබිය හැකි වීම.
- පෙරහර නර්තන අතර පතුරු නැටුම් දැකිය හැකි වීම.
- ආගමික හා ජන විශ්වාස කවිවල දක්නට ලැබීම.

  පතුරු නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම.

පියවර 2
- පතුරු නර්තනය සඳහා භාවිත කරන උපකරණය 'පතුර' යනුවෙන් හඳුන්වන අතර, එයින් ශබ්දය නිකුත් වන ආකාරයට සකස් වීම.
- ශරීරයේ විවිධ ස්ථානවලට පතුරෙන් තට්ටු කරමින් ශබ්දය නිකුත් වන පරිදි නර්තනයේ යෙදීම.
- සාමූහික ව නර්තනයක් වුව ද පතුර තනි ව ගසමින් රංග රටා ගොඩනැඟීම.

පියවර 3
- පතුර සකස් කර ගන්නා ආකාරය විස්තර කිරීම.
- එහි සැකැස්ම අඟල් 18ක් පමණ දිගින් ද අඟල් දෙකක් පමණ පළලින් ද අඟල් 1/2ක් පමණ ගනකමකින් ද යුක්ත වීම. පතුරක් ගෙන මැදින් කොටසක් දෙකක් ඉවත් කර පතුර අලංකාර ව නිමවා තිබීම.

පියවර 4
- සියලු කරුණු අදාළ කර ගනිමින් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- පතුරු නර්තනයේ සුවිශේෂ ලක්ෂණ විමසන්න.
- පතුරු නර්තනය සඳහා පතුරක් සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

සැ.යුඃ සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.3** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.3.2** : පතුරු (නැටුම) නර්තනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි

**ඉගෙනුම් පල** :

- උපකරණ නිසි අයුරින් භාවිත කරමින් පතුරු නැටුමට උචිත පද නිර්මාණය කරයි.
- පතුරු නැටීමේ දී උචිත රංග රටා භාවිත කරයි.
- අවකාශය නිසි ලෙස භාවිත කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව නර්තන අංග ඉදිරිපත් කරයි.
- ගායනය ට හා වාදනය ට අනුව නිමාවකින් යුත් පතුරු නැටුමක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පතුරු නැටුමේ කවි සටහන් කළ කාඩ්පත්, සංයුක්ත තැටි (CD) /දෘශ්‍ය සංයුක්ත තැටි (VCD) ගැටබෙරය, පහතරට බෙරය, තම්මැට්ටම, දවුල, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

: පතුරු කවි ගායනය කරමින් පාඩමට පිවිසීම.

පියවර 1
- උපකරණය අතෙහි රඳවන ආකාරයත්, එය ශරීරාංගවලට තට්ටුකිරීමෙන් පතුරෙන් ශබ්දයක් නිකුත් වන ආකාරයත් පිළිබඳ ව සිසුන් දැනුම්වත් කිරීම.

පියවර 2
- පතුරු නැටුමට උචිත පද, නිර්මාණය කිරීමට යොමු කිරීම. එහි දී හිස, උරහිස, වැළමිට, දණහිස, යටිපතුල වැනි ශරීරාංගවලට තට්ටු කිරීමෙන් චලන නිර්මාණ කිරීමට යොමු කිරීම.

පියවර 3
- නිර්මාණය කරන ලද පද ගායනය හා වාදනය සමග අභ්‍යාස කිරීම.

පියවර 4
- අවකාශ භාවිතය රංග රටා හා විවිධ තාලරූප පිළිබඳ ව අවධානය යොමු කරමින් නර්තනයේ යෙදීම හා සාමූහිකත්වයෙන් යුතු ව ප්‍රාසංගික නර්තන අංගයක් ඉදිරිපත් කිරීම.

පියවර 5
- සියලු කරුණු අදාළ වන පරිදි සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කවි ගායනයට අනුව පතුරු නර්තනයට සුදුසු පද දෙකක් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

- ප්‍රාසංගිකත්වය සඳහා රංග රටා යොදා ගනිමින් කණ්ඩායම් අනුව පතුරු නැටුමක් ඉදිරිපත් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

ඇමුණුම :

**පතුරු කවි**

තාලරූපය : - මාත්‍රා 4 තනි තිත හෝ අදාළ වෙනත් තාල රූපයක්

තානම :

තාන තනා තම් දෙ නා තම්දෙ නානා
තෙතන තනා තම්දෙ නා තම්දෙ නා නා

(1) සූරිය කුල ඇති හිරු දෙවියන්නේ
පෑවිය අණසක ලොව පවතින්නේ
කාරිය සිතුවා සාදා දෙන්නේ
පතුරු නැටීමට අවසර දෙන්නේ

(2) ලොව සෙත් කරවන පත්තිනි සදින්නේ
සලඹත් අරගෙන සළු සලව මිනේ
වෙනසක් නොසිතා මගෙ ගුරුවරුනේ
පතුරක් අරගෙන රගනෙමු තොසිනේ

(වදන් කවි පොත)

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.3** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.3.1** : සවරං නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- සවරං නැටුම ගැමි නැටුම් විශේෂයක් බව ප්‍රකාශ කරයි.
- විනෝදාස්වාදය සඳහා සවරං නැටුම යොදා ගන්නා බවට කරුණු ඉදිරිපත් කරයි.
- පෙරහර නර්තනවල සවරං නැටුම සුවිශේෂ බවට කරුණු දක්වයි.
- සවරං නැටීම සඳහා භාවිත කරන උපකරණය සකස් කර ගන්නා අයුරු විස්තර කරයි.
- සවරං නැටුම හා බැඳි ගායනවල ආගමික සම්බන්ධතාවක් ඇති බව විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සවරං නැටුම සඳහා භාවිත කරන උපකරණ/පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** : සවරං නැටුම හා සම්බන්ධ කවියක් ශ්‍රවණයට සැලැස්වීම.

පියවර 1
- සවරං නැටුම පිළිබඳ ව පහත සඳහන් කරුණු ඇසුරෙන් සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවීම.
- සවරං නැටුම ගැමි නැටුම් විශේෂයක් වීම.
- විනෝදාස්වාදය සඳහා යොදාගැනීම
- පෙරහරක දී දක්නට ලැබෙන නර්තන අතර සවරං නැටුම දක්නට ලැබෙන බව
- සවරං නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම.

පියවර 2
- සවරං නර්තනය සඳහා භාවිත කරන උපකරණය (සවරම) යනුවෙන් හැඳින්වීම හා භාවිතයට ගන්නා අයුරු සාකච්ඡා කිරීම.
- කරකැවීමේ පහසුව සඳහා සැහැල්ලු ලී වර්ගයක් භාවිත කිරීම.
- සවරං ලීයේ දෙපැත්ත ම රැලි යොදා ඇති අතර සවරම මැදින් අල්ලා ගැනීම හා එය ඇඟිලිකරු අතර සිර කර ගැනීම.
- සවරම වට කරකැවීමත් විවිධ දිසාවලට චලනය කිරීමත් නිසා සවරං නැටුම අලංකාර වීම.
- සවරං එකිනෙකට නොගැටෙන ලෙස නර්තනයේ යෙදීම.

පියවර 3
- සවරම සකස් කරන අයුරු විස්තර කිරීම.
- එහි සැකැස්ම අඟල් 18ක් පමණ දිග ලී කැබැල්ලක දෙපස විචිත්‍ර වර්ණවත් රැලි සමූහයකින් නිමවා තිබීම.

පියවර 4
- සියලු කරුණු අදාළ වන පරිදි සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- සවරං නර්තනයේ සුවිශේෂ ලක්ෂණ 3ක් නම් කරන්න.
- අලංකාර සවරමක් නිර්මාණය කරන අයුරු විස්තර කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

පැවිය ගල්නැවෙන් ජයරුස් වඩින්නට
වීරිය කර සිතින් ගන දුරු හරින්නට
කාරිය තමයි සවරං ගෙන රඟන්නට
සූරිය දෙව්රජුනි අවසර දෙවන් මට

දැතට ගන්නේ සවරම පවන් සලන්නේ
සරඹ පාන්නේ පා පොඩි දෙක හසුරන්නේ
ගීත කියන්නේ සුමිහිරි තාල වයන්නේ
සබයට එන්නේ සවරං නැටුම් නටන්නේ
(මාත්‍රා 3 තනිතිත)

මල් ගවසාලා කොණ්ඩය බැඳලා
ඉණ තද කර සළු පැලඳගෙනේ
පියයුරු නම් ලා එන ළැම උදුලා
සළු පටකින් වසමින් යසිනේ

සිරියල් දීලා කට රතු කරලා
නා දල් මෙන් තොල් දිලිසෙමිනේ
දෙවියන් වැඳලා මෙරඟට බැසලා
පටන් ගනිමු සවරන් රැගෙනේ

(මාත්‍රා 4 තනි තිත)

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.3** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**විෂය අන්තර්ගතය** :

**ක්‍රියාකාරකම 1.3.2** : සවරං නැටුම නර්තනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- උපකරණ නිසි අයුරින් භාවිත කරමින් සවරං නැටුමට උචිත පද නිර්මාණය කරයි.
- සවරං කවි ගායනය කරමින් නර්තනයේ යෙදෙයි.
- සවරං නැටුමට උචිත රංග රටා භාවිත කරයි.
- සවරම භාවිත කරමින් බෙර වාදනයට අනුව නර්තනයේ යෙදෙයි.
- අවකාශය නිසි ලෙස භාවිත කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව නර්තන අංග ඉදිරිපත් කරයි.
- ගායනයට හා වාදනයට අනුව නිමාවකින් යුත් සවරං නැටුමක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සවරං කවි සටහන් කළ කාඩ්පත් , ගැටබෙරය, පහතරට බෙරය, තම්මැට්ටම, දවුල, තාලම්පට, සංයුක්ත තැටි, දෘශ්‍ය සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

: සවරං කවි ගායනය කරමින් පාඩමට පිවිසීම.

පියවර 1
- උපකරණය දෑතෙහි රඳවන ආකාරය පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීම.

පියවර 2
- සවරං නැටුමට උචිත පද නිර්මාණය කර ගැනීමට යොමු කිරීම. (එහි දී සවරම රැළි විසිරී යන ආකාරයට කරකැවීම, මැණික් කටුව ළඟින් චලනය කරමින් සවරම දෙපසට චලනය කිරීම, අත් දෙක ඉහළට ඔසවා සවරම කරකැවීම)

පියවර 3
- නිර්මාණය කරන ලද පද ගායනය, වාදනය සමඟ අභ්‍යාස කිරීම.

පියවර 4
- අවකාශ භාවිතය ,රංග රටා හා විවිධ තාලරූප පිළිබඳ ව අවධානය යොමු කරමින් සාමූහිකත්වයෙන් යුතු ව ප්‍රාසංගික නර්තන අංගයක් ඉදිරිපත් කිරීම.

පියවර 5
- සියලු කරුණු අදාළ කර ගනිමින් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය**
**සඳහා උපදෙස්** :

- කවි ගායනයට අනුව සවරං නර්තනයට සුදුසු පද දෙකක් නිර්මාණය කරන්න.
- ප්‍රාසංගිකත්වය සඳහා රංග රටා යොදාගනිමින් කණ්ඩායම් අනුව සවරං නැටුමක් ඉදිරිපත් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : ශාරීරික නම්‍යතාව සඳහා අභ්‍යාස ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.1** : නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- නම්‍යතා අභ්‍යාස කිරීමේ දී නිවැරදි විධික්‍රම අනුගමනය කරයි.
- අංග, ප්‍රත්‍යංග, උපාංග නිවැරදි ව හසුරුවයි.
- ඒකල හා සාමූහික වශයෙන් නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සංගීත ඛණ්ඩයක්/බෙරය /තාලම්පට/ දෘශ්‍ය සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** : 7 ශ්‍රේණියේ දී ඉගෙනගත් නම්‍යතා අභ්‍යාසවලට අමතර ව 8 ශ්‍රේණියට නියමිත නම්‍යතා අභ්‍යාස හතරක් අභ්‍යාස කරන්න. මෙහි දී නර්තනයට පිටිවහලක් වන පරිදි යොදා ගැනීම කළ යුතු වේ.

පියවර 1

- දෘශ්‍ය සංයුක්ත තැටි ආධාරයෙන් අභ්‍යාස ප්‍රදර්ශනය කර ශරීරයේ කුමන අංග, ප්‍රත්‍යංග, උපාංග භාවිත කරන්නේ ද පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- නර්තනයට එම අභ්‍යාස වැදගත් වන අයුරු පිළිබඳ ව සිසු අදහස් විමසීම.

පියවර 2

- සංගීත ඛණ්ඩයට අනුව හෝ බෙර වාදනයට අනුව හෝ අභ්‍යාස හතර පියවරෙන් පියවරට ඉදිරිපත් කරමින් සිසුන් අභ්‍යාස කිරීම සඳහා යොමු කිරීම.

පියවර 3

- කණ්ඩායම් වශයෙන් අභ්‍යාස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4

- සියලු කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු ව එම ඉදිරිපත් කිරීම් පිළිබඳ ව සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- සෑම අභ්‍යාසයක් ම නර්තනයට හා ශාරීරික සුවතාවට ඉවහල් වන අයුරු පිළිබඳ ව අදහස් දක්වන්න.
- කණ්ඩායම්/ඒකල වශයෙන් අභ්‍යාස ඉදිරිපත් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : පාද නිවැරදි ව හැසිරවීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.2** : නර්තනයට පාද හුරු කර ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :
- පාසරඹ/මණ්ඩිපද තාල තබමින් කියයි.
- විධික්‍රම අනුගමනය කරමින් පා සරඹ/මණ්ඩි පද ඉදිරිපත් කරයි.
- 7-9 තෙක් වූ පා සරඹ/ මණ්ඩි පද කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරයි.
- නිවැරදි අංගහාර හා ඉරියවු අනුගමනය කරමින් පා සරඹ/මණ්ඩි පද ඉදිරිපත් කරයි.
- විලම්බ හා මධ්‍ය ලය පිළිබඳ ව අවබෝධයෙන් යුතුව පාසරඹ/ මණ්ඩිපද ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම්පට, පා සරඹ/මණ්ඩි පද ලියූ සටහන්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** 7 ශ්‍රේණියේ දී ඉගෙන ගත් පා සරඹ/ මණ්ඩි පද අභ්‍යාස කර අනතුරු ව 8 ශ්‍රේණියට නියමිත පා සරඹ /මණ්ඩි පද අභ්‍යාසයට යොමු කරවන්න.

පියවර 1
- 7- 9 තෙක් වූ පා සරඹ/මණ්ඩි පද තාල තබා කීමට යොමු කිරීම.

පියවර 2
- අදාළ පා සරඹ /මණ්ඩි පදවල පාද තබන අයුරු ප්‍රදර්ශනය කර අභ්‍යාස කිරීම සඳහා යොමු කිරීම.

පියවර 3
- සිසුන් කණ්ඩායම් කර පා සරඹ/ මණ්ඩිපද විලම්බ, මධ්‍ය ලයට අභ්‍යාස කිරීමට යොමු කිරීම.

පියවර 4
- නිවැරදි අංගහාර සහිත ව 7-9 පා සරඹ/මණ්ඩි පද හමාර පදය සමඟ ඉදිරිපත් කිරීමට යොමු කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- සියලු කරුණු අදාළ කර ගනිමින් සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- 7-9 පා සරඹ/මණ්ඩිපද විලම්බ, මධ්‍ය ලයට තාල තබා කියන්න.
- 7-9 දක්වා වූ පා සරඹ/මණ්ඩි පද කණ්ඩායම් වශයෙන් නිවැරදි අංගහාර සහිත ව ඉදිරිපත් කරන්න.
- නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරන /නොකරන සිසුන් තෝරාගෙන අවශ්‍ය පරිදි සියලු ම සිසුන්ගේ අංගහාර නිවැරදි ව ප්‍රදර්ශනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර පසු ව ඇගයීමක් කරන්න.

(එක් එක් සරඹය අවසානයේ ඇගයීමට ලක් කිරීම ප්‍රතිපෝෂණ කාර්යයට වඩාත් පහසු වේ.)

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**උඩරට නර්තන සම්ප්‍රදායය**

**පා සරඹ**

7. තාතෙයි තාතෙයියත් තා
8. තෙයියත් /// තම් තේයි තත්තක තෙයියත්තාම්
9. තේයි තත්තක තෙයි තෙයි තත්තක තේයි තත්තක තෙයියත් තාම්

**පහතරට නර්තන සම්ප්‍රදායය**

**පා සරඹ**

7. තෙයියත් තා කිට - තෙයියත් දොම් ගත
8. තෙයියත් තා කිට - තෙයියත් ගහිති ගතම්
9. තෙයියත් තරිකිට තෙයියත් දිරිකිට

**සබරගමු නර්තන සම්ප්‍රදායය**

**මණ්ඩි පද**

7. තෙයි ගත කුඳ තෙයි තකට //
   තෙයි ගත කුඳ /// තෙයි තකට
8. තෙයි දොම් - තෙයියත් දොම්
9. තා තරිකිට තාතෙයි //
   තා තෙයි //

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** : නර්තනය හා සබැඳි විධික්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.3** : සාම්ප්‍රදායික නර්තනයට හස්ත පාද හුරු කර ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- සරඹ පද විලම්බ හා මධ්‍ය ලය අනුව තාල තබමින් කියයි.
- කස්තිරම/ඉරට්ටිය/හමාර පදය තාල තබමින් කියයි.
- විධික්‍රම අනුගමනය කරමින් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි.
- විලම්බ හා මධ්‍ය ලය අනුව සරඹ අභ්‍යාස කරයි.
- බෙර වාදනයට අනුව නිවැරදි අංගහාර සහිත ව සරඹ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, සරඹ පද ලියන ලද සටහන්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** : 7 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද සරඹ පිළිබඳ මතකයට යොමු කර සරඹ කීපයක් නර්තනය කිරීමට සැලැස්වීම.

පියවර 1

සිසුන් විසින් ඉදිරිපත් කරන ලද නර්තන ඇසුරු කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවීම
- හස්ත, පාද චලන
- ශරීරයේ අංගහාර ලක්ෂණ
- පාද තබන අනුපිළිවෙළ
- සාම්ප්‍රදායික ලක්ෂණ

පියවර 2
- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද 5 - 6 දක්වා සරඹ පද තාල තබා කීමට යොමු කිරීම.

පියවර 3
- ගොඩ සරඹ /ඉලංගම් සරඹ/ දොඹින පද 5-6 සරඹ පද නර්තනය කිරීම

පියවර 4
- 5-6 සරඹවල සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කර ඒවා ප්‍රදර්ශනය කිරීම.
- බෙර වාදනයට අනුව ගොඩ සරඹ / ඉලංගම් සරඹ/ දොඹින පද කස්තිරම /ඉරට්ටිය හමාර පදය සමගින් නර්තනය කිරීමට යොමු කිරීම.

පියවර 5
- ඉගෙන ගන්නා ලද 5, 6 සරඹ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට සලස්වා ඒ පිළිබඳ ව සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- 5,6 ගොඩ සරඹ / ඉලංගම් සරඹ /දොඹින පද කස්තිරම/ඉරට්ටිය/හමාර පදය, විලම්බ හා මධ්‍ය ලයට තාල තබා කියන්න.
- නියමිත අංගහාර අනුගමනය කරමින් කණ්ඩායම් වශයෙන් ගොඩ සරඹ /ඉලංගම් සරඹ /දොඹින පද 5, 6 ඉදිරිපත් කරන්න.

සැ.යු - සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**උඩරට නර්තන සම්ප්‍රදායය (ගොඩ සරඹ)**

**5 වැනි සරඹය**

පදය - දොම් කිට කිට දොම්

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුංදත්
තාග්ග ජිත්තක තරිකිට කුංදත්
රුංතක ජිංතක තරිකිට කුංදත්තා

**6 වැනි සරඹය**

පදය - දොම් කිට කිට දොම්

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුංදත් //
තාග් ගජිංතක තරිකිට කුංදත්
රුංතක ජිංතක තරිකිට කුංදත්තා

**සබරගමු නර්තන සම්ප්‍රදායය - දොඹින පද**

**5 වැනි පදය**
තෙයියත් තත්තක - තෙයිතෙයි තත්තක
තෙයියත් තත්තක තෙයියත් තා

**6 වැනි පදය**
තහර් රුඳ රුඳ /// තහර් රුඳා

**පහතරට නර්තන සම්ප්‍රදායය - ඉලංගම් සරඹ**

**05 වැනි සරඹය**
ගුදිත ගතම් ගත
ගදිත ගතම් ගුද

ඉරට්ටිය
ගුදිත ගුදිත්තම්, ගදිත ගදිත්තම්
දොංත ගදිත ගත ගදිගත ගුදි ගුද තා

**06 වැනි සරඹය**
ගදිගත ගුදිගුද රෙගතත් දිගතම් (දිතගත)

ඉරට්ටිය
ගදිගත ගුදගත් දිගතම් දිගතම්
ගුදිගත ගුදගත් දිගතම් දිගතම්
ගදිගත ගුදගත්, ගුදිගත ගුදගත්
ගදිගත, ගුදිගුද, රෙගතත් දිගතම්

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.4** : සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අලංකාර මාත්‍රා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 2.4** : "බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ" ( මැදුම් තනි තිතට )

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- මැදුම් තනි තිතට අලංකාර මාත්‍රා නිර්මාණ කරයි.
- අදාළ තිතට අනුව අලංකාර මාත්‍රා ඉදිරිපත් කරයි.
- නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රා විවිධ නර්තන අංග සඳහා භාවිතයට ගත හැකි බව ප්‍රකාශ කරයි.
- බෙර වාදනයට අනුව සාමූහික ව අලංකාර මාත්‍රා නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** : මැදුම් තනි තිතේ තාල රූපයට අනුව අලංකාර මාත්‍රා නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.

පියවර 1
- පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න. එක් කණ්ඩායමක් එක අලංකාර මාත්‍රය බැගින් නිර්මාණය කිරීමට යොමු කිරීම හා අවශ්‍ය මඟ පෙන්වීම් කිරීම.

.පියවර 2
- නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රය කණ්ඩායම් වශයෙන් පුහුණු වීමට සලස්වා අවශ්‍ය උපදෙස් ලබාදීම

පියවර 3
- බෙර වාදනයට අනුව අලංකාර මාත්‍රා නර්තනයට අවස්ථාව ලබාදීම.

පියවර 4
- එක් එක් කණ්ඩායම මඟින් නිර්මාණය කරන ලද මාත්‍රා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම, එම මාත්‍රා අනෙක් කණ්ඩායම්වලට ද නර්තනය කිරීමට සැලැස්වීම.

පියවර 5
- සියලු සිසුන් බෙර වාදනයට අනුව නර්තනය කිරීමට සැලැස්වීම.
- සියලු කරුණු අදාළ කර ගනිමින් සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රාවල සාම්ප්‍රදායික නර්තනයන්හි චලන ඇතුළත් වී තිබේ දැයි නිරීක්ෂණය කරන්න.
- නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රා යොදා ගනිමින් නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.
- බෙර වාදනයට අනුව නර්තනය ඉදිරිපත් කිරීමට සලස්වන්න. ඉදිරිපත් කරන ලද අලංකාර මාත්‍රාවල දී යොදාගත් චලනවල උචිත අනුචිත බව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සුදුසු නිර්ණායක අනුව ඇගයීමට ලක් කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.5** : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.5.1** : "වන්නම් ගයමින් නටමු"

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- 7 ශ්‍රේණියේ දී ඉගෙන ගන්නා ලද වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.
- තුරඟා වන්නම හවාදි තාලය සින්දු වන්නම /කුදිරඩි වන්නමට අදාළ කස්තිරම, සීරුමාරුව, අඩව්ව/ ඉරට්ටිය/කලාසම, අඩව්ව තාල තබමින් කියයි.
- වන්නමට අදාළ කස්තිරම, සීරුමාරව, අඩව්ව/ ඉරට්ටිය/කලාසම, අඩව්ව බෙරවාදනයට අනුව නර්තනය කරයි.
- වන්නම බෙර වාදනයට අනුව ගායන කරමින් නර්තනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට
වන්නම සටහන් කරන ලද කාඩ්පත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

7 ශ්‍රේණියේ දී උගන්වන ලද තුරඟා වන්නම/ හවාදි තාලය සින්දු වන්නම/කුදිරඩි වන්නම ගායනා කරමින් බෙර වාදනයට අනුව නර්තනය කිරීමට සලස්වා සිසු සාධන මට්ටම සැලකිල්ලට ගනිමින් වන්නමේ ඉතිරි කොටස් ඉගැන්වීම.

පියවර 1

- තුරඟා වන්නම /හවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නම සටහන් කරන ලද කාඩ්පත් ලබාදීම. කස්තිරම, සීරුමාරව/අඩව්ව /ඉරට්ටිය/ කලාසම/ අඩව්ව තාල තබමින් කීමට යොමු කිරීම.

.පියවර 2

- කොටස් වශයෙන් කස්තිරම, සීරුමාරුව, අඩව්ව/ඉරට්ටිය/කලාසම, අඩව්ව නර්තනය කර පෙන්වීම. ගුරුවරයා අනුකරණය කරමින් සිසුන් නර්තනයේ යෙදවීම. නර්තනයේ දී නිවැරදි අංගහාර අනුගමනය කිරීමට උපදෙස් ලබාදීම.

පියවර 3

- කණ්ඩායම් වශයෙන් නර්තනය කිරීමට සැලැස්වීම හා අවශ්‍ය මඟ පෙන්වීම.

පියවර 4

- බෙර වාදනයට අනුව වන්නම සම්පූර්ණයෙන් නැටීම හා සමාලෝචනය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- තුරඟා/හවාදි තාලය සින්දු වන්නම/කුදිරඩි වන්නම තාල තබමින් ගායනය කරවීම.
- ගායනය සමඟින් බෙර වාදනයට අනුව වන්නම සම්පූර්ණයෙන් නර්තනය කිරීමට සැලැස්වීම.

සැ.යු: සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

තුරඟා වන්නම - කස්තිරම කුද ගජිත /// කුඳ තා //
කුද ගජිත කුද තා //
කුද තා //
කුද ගජිත /// කුඳ තා

සීරු මාරුව
තකු තකට ගත දොංත ගජ්ජිං ගජිං තකට
තකු තකට ගත දොංත දොංතා

අඩව්ව

තත් තකට තක රොං, තක්කඩ තක්කඩ කුඳ තක රොං
තක රොංගජිං ජිගත කිටි තකට කුංදත්
ජික රොං

කුදිරඩි වන්නම - කලාසම

ජිං ගතත් ජෙං තා ////
ජිං ගතත් ගත් තකට
ජිං ගතත් ජෙං තා

අඩව්ව

තත් තරිගු තත් තකට
ජෙප් ජෙං කුදත් තකට
තහර් ජිත් කිනං තකට
තරිකිට තකට ජෙංතා

හවාදි තාලය සින්දු වන්නම

ඉරට්ටිය - දිං ගදි ගතම් දොම්ත ගත ගහිති ගතම්
තත් තත් ගුඳ ගති ගතම් දොම්ත ගත ගහිති ගතම්
දොම් දොම්

| | | |
|---|---|---|
| **නිපුණතාව 2.0** | : | නර්තන ය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 2.5** | : | නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. |
| **ක්‍රියාකාරකම 2.5.2** | : | "වන්නම් ගයමින් නටමු" |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 04 |
| **ඉගෙනුම් පල** | : | • වෛරොඩි/ඊශ්වර කුණ්ඩතාලය/කදම්බ පක්ෂි වන්නමට අදාළ බෙර පදය තාල තබමින් කියයි.<br>• අදාළ තිත් රූපයට අනුව වන්නමේ පද නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් නර්තනයේ යෙදෙයි.<br>• කස්තිරම/ඉරට්ටිය/කලාසම තාල තබමින් කියයි.<br>• නිවැරදි තාල රූපය අනුව කස්තිරම/ඉරට්ටිය/කලාසම ඉදිරිපත් කරයි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | බෙරය, තාලම්පට<br>වන්නම සටහන් කරන ලද කාඩ්පත් |
| **ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** | : | වෛරොඩි/ඊශ්වර කුණ්ඩතාලය/කදම්බ පක්ෂි වන්නම නර්තනයට පෙර තාල රූපය, බෙර පදය හඳුන්වා දී වන්නම නර්තනයට ප්‍රවේශ වීම. |
| පියවර 1 | | • වන්නම් සටහන් කරන ලද කාඩ්පත් සිසුන්ට ලබා දී තාල තබමින් සාමූහික ව වන්නම ගායනය කරවීම.<br>• වන්නමේ තානම /කවි ගායන කරමින් හස්ත චලනය කරන ආකාරය පුහුණු කරවීම.<br>• හස්ත චලනය සිදු කරන විට ශරීරයේ තිබිය යුතු නිවැරදි හැඩතල පවත්වා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම. |
| .පියවර 2 | | • වන්නමට අදාළ තාල රූපයට අනුව පද නර්තනය කිරීමට සිසුන් යොමු කිරීම.<br>• පද නර්තනයේ දී ගායනයත් සමඟ ම නර්තනයේ යෙදීමට යොමු කිරීම. |
| පියවර 3 | | • කස්තිරම/ඉරට්ටිය/කලාසම තාල තබමින් කීමට සැලැස්වීම. අනතුරු ව කොටස් වශයෙන් එය පුහුණු කරවීම හා පියවරෙන් පියවර අභ්‍යාසයේ යෙදවීම. ගුරුවරයා අනුකරණය කරමින් නර්තනයට සිසුන් යොමු කිරීම. |
| පියවර 4 | | • සිසු සාධනය සැලකිල්ලට ගනිමින් කණ්ඩායම් කිහිපයකට වෙන්කොට අභ්‍යාසයේ යෙදවීම. ගුරුවරයා බෙර වාදනයෙන් සහාය වීම. |
| පියවර 5 | | • කණ්ඩායම් වශයෙන් වන්නම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. කණ්ඩායමක් නර්තන ඉදිරිපත් කරන විට සෙසු කණ්ඩායම් තාල තබමින් ගායනයෙන් සහාය වීම. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වෛරොඩි/ඊශ්වර කුණ්ඩතාලය/කදම්බ පක්ෂි වන්නම හා අදාළ බෙර පදය තාල තබා කියන්න.
- ගායනය කරමින් වන්නම නර්තනය කර කස්තිරම/ඉරට්ටිය/කලාසම නර්තනය කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

### කදම්භ පක්ෂි වන්නම

තාලරූපය : මාත්‍රා 3 තනි තිත

දවුල් පදය : ජිංගත් ගතත් ගත කුද
දොංත ජිංතරිකිට ජිංතරිකිට තකට

තානම : තම් දනත් තනත් තනතම්
දනතානා - තන
තෙයි තනත් තනත් තනතම්
දන තානා .......... නා

කවිය : වත්පසන් ලෙසින් බබළන
මෙන් තානා ලිය
වත් කැලුම් නොමින් නිබඳ ව විහිදුවා
සිත් සතොසින් ගොසින් ගිරිකුළ
ගොස් යහනාවක
පත්වෙමින් ගොසින් විල් අසලක සේමා
සිත් ලෙසින් පසන් කොවුලිඳු රුක් සෙවණැලිකුල
ගත් තුඩින් නෙළා පල රස වැළඳීමා
මෙත් සිතින් අසන් වියතුනි දෙසවන් දී යස
කදම්බ පක්ෂි වන්නමෙ රඟ මෙහෙමා

### ඊශ්වර කුණ්ඩතාලය

කවිය

කිපී ලොව දිලෙන තද තෙදැති දිනිඳු ගේ
හැපී දුක් රැසින් උන් සත ගොස් නොල ගේ
පිපී වත කමල් විල තඹර නිකල ගේ
නොපීනනු කවුද වෙන් සරණ රුස් ග ගේ

ඉරට්ටිය

දොංතක තදි කිත තරිකිට ගත ගුගුද
ගුගුදිත් තා තහ තහකඩ දොහොකඩ දිත්
තරිකුංදික් කිට ගුගු දා

**නිපුණතාව 2.0** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.6** : විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම 2.6.1** : සුළු මහ දෙතිතේ තාලයට බෙරපද/දවුල් පද ප්‍රස්තාර කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :

- ප්‍රස්තාරකරණය මූලධර්ම අනුගමනය කරමින් ප්‍රස්තාර සටහන නිවැරදි ව පිළියෙළ කරයි.
- සුළු මහ දෙතිතේ තාලයට බෙරපද/දවුල් පද තාල තබා කීමෙන් තාලාවබෝධය ලබයි.
- අදාළ පද කොටස් නිවැරදි ව ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරපද/දවුල් පද / ලියන ලද කාඩ්පත්/තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** : ගුරුවරයා විසින් සුළු මහ (2 + 4) දෙතිතට අදාළ බෙර පදය වාදනය කර හෝ කවියක කොටසක් ගායනා කර තාල තැබීමට සිසුන් යොමු කිරීම.

- ප්‍රස්තාරකරණය සඳහා වගුව පිළියෙල කර ගැනීමට සිසුන් යොමු කිරීම.

පියවර 1
- අදාළ කොටස් ප්‍රස්තාර ගත කරන අන්දම හඳුන්වා දී සිසුන් ප්‍රස්තාරකරණයේ යෙදවීම.

.

පියවර 2
- සිසුන් කාර්යයේ යෙදෙන අතරතුර ගුරුවරයා ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම.

පියවර 3
- අදාළ කොටස් තාල තබමින් කීමට සැලැස්වීම. ඒ මඟින් තම ප්‍රස්තාර සටහනේ නිවැරදි බව තහවුරු කර ගන්නා අයුරු සිසුන්ට විස්තර කිරීම.

පියවර 4
- ප්‍රස්තාර කරන ලද සටහන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. ප්‍රස්තාර සටහන්වල නිවැරදිතාව පිළිබඳ සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- මාත්‍රා (2 + 4 ) දෙතිතේ තාල රූපය සඳහා ප්‍රස්තාර සටහනක් පිළියෙළ කරන්න.
- තාලස්ථාන හා නිවැරදි සංඥා ලකුණු කරන්න.
- අදාළ පද කොටස් නිවැරදි ව ප්‍රස්තාර කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 2.0** | : | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 2.6** | : | විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. |
| **ක්‍රියාකාරකම 2.6.2** | : | නිර්දේශිත කවි /පද ප්‍රස්තාර කරමු |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 02 |
| **ඉගෙනුම් පල** | : | • වෛරොඩි /ඊශ්වර කුණ්ඩතාලය/කදම්බ පක්ෂි වන්නම බෙරපදය සිට කස්තිරම /ඉරට්ටිය/කලාසම තෙක් ප්‍රස්තාර කරයි.<br>• 7 ශ්‍රේණියේ දී ඉගෙනගත් වන්නමට අදාළ සීරුමාරුව අඩව්ව/ ඉරට්ටිය/ කලාසම ප්‍රස්තාර කරයි.<br>• සිරසපාද කවි, සවරම් කවි, පතුරු කවි ප්‍රස්තාර කරයි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | නිර්දේශිත කවි සහ වන්නම සටහන් කරන ලද කාඩ්පත් |

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

| | |
|---|---|
| පියවර 1 | • වෛරොඩි /ඊශ්වර කුණ්ඩතාලය/කදම්බ පක්ෂි වන්නම බෙරපදය සිට කස්තිරම /ඉරට්ටිය/කලාසම තෙක් ප්‍රස්තාර කිරීමට යොමු කිරීම, අවශ්‍ය උපදෙස් ලබාදීම. |
| පියවර 2 | • 7 ශ්‍රේණියේ දී ඉගෙනගත් වන්නමට අදාළ සීරුමාරුව අඩව්ව/ ඉරට්ටිය/ කලාසම අඩව්ව ප්‍රස්තාරකරණයට යොමු කිරීම. |
| පියවර 3 | • නිර්දේශිත කවි ප්‍රස්තාර කිරීමට යොමු කිරීම. (සිරසපාද, සවරම්, පතුරු) ගායනයට අනුකූල ව ප්‍රස්තාර කිරීමේ දී නිවැරදි විධික්‍රම අනුගමනය කිරීමට උපදෙස් ලබාදීම - අදාළ අවස්ථාවල දී සිසුන්ට අවශ්‍ය මඟ පෙන්වීම. |
| පියවර 4 | • ප්‍රස්තාර කරන ලද සටහන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සහ ප්‍රස්තාර සටහන්වල නිවැරදි බව සාකච්ඡා කිරීම. |
| පියවර 5 | • සියලු කරුණු අදාළ කර ගනිමින් සමාලෝචනය කිරීම. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන විධික්‍රම නම් කරන්න.
- වෛරොඩි /ඊශ්වර කුණ්ඩතාලය/කදම්බ පක්ෂි වන්නම බෙරපදය සිට කස්තිරම /ඉරට්ටිය/කලාසම තෙක් ප්‍රස්තාරකරන්න.
- ඉගෙනගත් වන්නමේ /සින්දු වන්නමේ අදාළ කොටස් ප්‍රස්තාර කරන්න.
- නිර්දේශිත කවි නියමිත තිත් රූප අනුව ප්‍රස්තාර කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 3.1** : පහතරට බෙරය පිළිබඳ තොරතුරු රැස් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පහතරට බෙරය හඳුන්වන වෙනත් නම් සඳහන් කරයි.
- පහතරට බෙරය වාදනය කරන අවස්ථා නම් කරයි.
- බෙරය සැකසීමට යොදාගන්නා අමුද්‍රව්‍ය නම් කරයි.
- බෙරයේ ව්‍යුහය හා සැකැස්ම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නියමිත පරිමාණයට අනුව රූප සටහන් ඇඳ කොටස් නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පහතරට බෙරය , බෙරයේ රූප සටහන්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

පියවර 1 :
- බෙර පදයක් වාදනය කර පහත සඳහන් කරුණු ඔස්සේ කෙටි සාකච්ඡාවක් කරන්න. පහතරට බෙරය හඳුන්වන වෙනත් නම් , බෙරය සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය හා වාදනය කරනු ලබන අවස්ථා

පියවර 2 :
- පහතරට බෙරයේ, රූපසටහනක් ප්‍රදර්ශනය කර සිසුන්ට නිරීක්ෂණය කිරීමට අවස්ථාව සැලසීම.

පියවර 3 :
- සිසුන් කණ්ඩායම් කර පහතරට බෙරය පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට පොත්පත් හෝ බෙරය පිළිබඳ විස්තර සහිත හෝ ඇමුණුමක් ලබාදීම.

පියවර 4
- බෙරයේ රූප සටහනක් ඇඳ කොටස් නම් කිරීමට යොමු කිරීම. (මෙහි දී සිසුන්ගේ අත්පොතක සටහන් කර ගැනීමට අවකාශය සැලසිය යුතු ය.)

පියවර 5
- සිසුන් විසින් රැස් කරන ලද තොරතුරු පහත දැක්වෙන වගුවට ඇතුළත් කිරීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- පහතරට බෙරය වාදනය කරනු ලබන අවස්ථා නම් කරන්න.
- පහතරට බෙරය සැකසීමට ගන්නා අමුද්‍රව්‍ය නම් කරන්න.
- පහතරට බෙරය හඳුන්වන වෙනත් නාමයන් දක්වන්න.
- නියමිත පරිමාණයට පහතරට බෙරයේ රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

| පහතරට බෙරය සැකසීමට ගන්නා අමුද්‍රව්‍ය | පහතරට බෙරය හඳුන්වන වෙනත් නම් | පහතරට බෙරය වාදනය කරන අවස්ථා | පහතරට බෙරයේ ව්‍යුහය | බෙරයේ කොටස් |
|---|---|---|---|---|
| ...................................... | ........................................... | ........................................... | බෙරයේ දිග ප්‍රමාණය | ............ |
| ...................................... | ........................................... | ........................................... | | ............ |
| ...................................... | ........................................... | ........................................... | බෙරයේ වට ප්‍රමාණය විෂ්කම්භය | |

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** : විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.2** : සතර බීජාක්ෂර සහ සරඹ පද වාදනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- සතර බීජාක්ෂර වාදනය කරන අයුරු විස්තර කරයි.
- සතර බීජාක්ෂර වාදනය කරයි.
- සතර බීජාක්ෂර මුල් කරගත් සරඹ පද වාදනය කරයි.
- සාමූහික ව සරඹ පද වාදනය කරයි.
- සුළු තනි තිතට අයත් බෙර පදයක් වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ගැට බෙරය/දවුල/පහතරට බෙරය
- තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

උඩරට/පහතරට/සබරගමු නර්තන සම්ප්‍රදායයන්ට අයත් සතර බීජාක්ෂර අයත් බෙරපද වාදනය කරමින් නර්තනය ගොඩනගන්න.

උදා:
අංගුලියා පදයෙන් කොටසක් වාදනය කර, පෙන්වා හෝ
තත්කඩ ජික්කඩ තොංගඩ නංගඩ - තත් ජිත් තොං නං
වැනි සතර බීජාක්ෂර මුල් කරගෙන ගොඩනැංවෙන බෙර පද
වාදනය කර පෙන්වා සිසුන්ට උපස්තම්භයක් ඇති වන අයුරින්
පාඩමට ප්‍රවේශය ගොඩනගා ගන්න.

පියවර 1 :
- උඩරට/පහතරට/සබරගමු නර්තන සම්ප්‍රදායයනට අයත් සතර බීජාක්ෂර මුල් කොටගෙන මූලික බෙරපද ගොඩනැඟෙන බව සිසුන් සමඟ සාකච්ඡා කිරීම.

පියවර 2 :
- සතර බීජාක්ෂර බෙරයෙන් වාදනය කිරීමේ දී උත්පාදනය වන ස්ථාන සහ එක් එක් බීජාක්ෂර වාදනය කරන විට දෑතේ ඇඟිලි හසුරුවන ආකාරය සිසුන්ට හඳුන්වා දී එය බෙරයෙන් වාදනය කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 3 :
- සතර බීජාක්ෂර වාදනය කිරීමේ දී ශබ්ද ධ්වනි එකිනෙකට වෙනස් බව හඳුන්වා දී වාදනය කර පෙන්වීම.

පියවර 4
- සරඹ සටහන් කරන ලද කාඩ්පත් සිසුන්හට බෙදා දී තාල තබා කීමට සැලැස්වීම.

පියවර 5
- බෙර පදය වාදනය කරන ආකාරය හඳුන්වා දී සාමූහික ව පද වාදනයට යොමු කිරීම.

පියවර 6
- කණ්ඩායම් වශයෙන් බෙර වාදනය සඳහා යොමු කර සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය**
**සඳහා උපදෙස්** :

- සතර බීජාක්ෂර යනු කුමක් දැයි විස්තර කරන්න.
- බීජාක්ෂර හතරෙහි ශබ්ද ධ්වනි එකිනෙකට වෙනස් බවට අදහස් දක්වන්න.
- කණ්ඩායම් වශයෙන් සතර බීජාක්ෂර වාදනය කරන්න.
- සතර බීජාක්ෂර මුල් වූ සරඹ පද තාල තබා කියන්න.
- එම සරඹ පද කණ්ඩායම් වශයෙන් වාදනය කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

සතර බීජාක්ෂර

උඩරට - තත් - ජිත් - තොං - නං
පහතරට - තත් - දිත් - තොං - නං
සබරගමු - තත් - ජිත් - තොං - නං

සතර බීජාක්ෂර මුල්කරගත් සරඹ පද
උඩරට - තක්කඩ - ජික්කඩ - තොංගඩ - නංකඩ
පහතරට - තත්ගුඳ - දිත්ගුඳ - තොංගුඳ - නංගුඳ
සබරගමු - තත්කඩ - ජික්කඩ - තොංගඩ - නංකඩ

සුළු තනි තිතට බෙර පද

- උඩරට - කුඳ ගත ගත දොම්
- පහතරට - රෙගුඳ ගතකු දොම්
- සබරගමු - ජිමිතකුඳා දොං

Þ

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.1** : නිර්දේශිත ගායනවල සමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 4.1** : ජන ගායනවල සමාජීය හා සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු. (වන්නම්- සිරසපාද කවි, පතුරු කවි/සවරං කවි)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- අදාළ ගායන භාවිතයට ගන්නා අවස්ථා නම් කරයි.
- ගායනයවල සමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.
- අදාළ ගායන රචනා වීමට හේතු සහ භාෂාත්මක විග්‍රහය පිළිබඳ සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සංයුක්ත තැටි, බෙරය, තාලම්පට, ගායන සටහන් කරන ලද කාඩ්පත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 1 : පන්තියේ සිසුන් කණ්ඩායම්වලට වෙන් කිරීම. නිර්දේශිත ගායන සටහන් කරන ලද කාඩ්පත් කණ්ඩායම්වලට බෙදා දී අදාළ ගායන ශ්‍රවණය කිරීමට සැලැස්වීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2 :

- අදාළ ගායනවල ඇති සුවිශේෂ ලක්ෂණ පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කිරීම.
  - නර්තනය හා සම්බන්ධ කවි විශේෂයන් වීම.
  - විවිධ තාල පදනම් වී තිබීම
  - එක් එක් ගායන සඳහා සුවිශේෂ නාද මාලා යොදාගැනීම.

පියවර 3 :

- එම ගායනවල සංස්කෘතික හා සමාජීය වටිනාකම් සාකච්ඡා කිරීම.
  - ගායනය භාවිත කරන අවස්ථා
  - සමාජීය හා ආගමික පසුබිම
  - ගායනය රචනා වීමට හේතු හා භාවිත කළ භාෂාව

පියවර 4 :

- එක් එක් කණ්ඩායමට අදාළ ජන ගායන විශේෂය පිළිබඳ ව රැස් කරගත් තොරතුරු කණ්ඩායම් වශයෙන් සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම සහ එම තොරතුරු පිළිබඳ ව සමාලෝචනයක යෙදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- අදාළ ගායනය අසන්නට ලැබෙන අවස්ථා නම් කරන්න.
- නිර්දේශිත ගායනවල සමාජීය සංස්කෘතික පසුබිම විස්තර කරන්න.
- එම ගායන විශේෂයන් රචනා වීමට හේතු සහ භාවිත කළ භාෂාව පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනය කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2** : "ජන කවි ගායනය කරමු"
(වෛරොඩි, ඊශ්වර කුණ්ඩතාලය කදම්බ පක්ෂි වන්නම්,සිරසපාද,පතුරු/සවරම් කවි)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :
- ගායනයවලට අදාළ තාල රූප නම් කරයි.
- නියමිත නාද මාලාවට අනුව ගායනය කරයි.
- බෙර වාදනයට අනුව තාල තබමින් ගායනය ඉදිරිපත් කරයි.
- ඒකීය හඬ තලයක පිහිටා ගායනය ඉදිරිපත් කරයි.
- සාමූහික ව ගායනය ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සංයුක්ත තැටි
බෙරය - තාලම්පට
ගායන සටහන් කරන ලද කාඩ්පත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** : සිසුන් ගායන ක්‍රියාකාරකම්වල සතුටින් යෙදවීමෙන් ගායන කුසලතාව වර්ධනය වන ආකාරයට ක්‍රියාකාරකම සැලසුම් කරගන්න.

පියවර 1 :
- නිර්දේශිත ගායන ශෛලිය ශ්‍රවණය කිරීමට සැලැස්වීම හා අදාළ තිත් රූපය හඳුනා ගැනීමට යොමු කිරීම. නිවැරදි නාද මාලාව හඳුනා ගැනීමට අවස්ථාව ලබාදීම. කවිය පදයෙන් පදය වෙන් වශයෙන් ගායනය කරවීම.

පියවර 2 :
- නිවැරදි නාද මාලාවට අනුව අදාළ කවි වර්ගය ගායනය කිරීමට සැලැස්වීම හා තාල තබමින් ගායනයට යොමු කිරීම.

පියවර 3 :
- කණ්ඩායම් වශයෙන් නිර්දේශිත කවි ඒකීය හඬ තලයක පිහිටා ගායනය කිරීමට උපදෙස් දීම.

පියවර 4 :
- සාමූහික වශයෙන් පන්තියේ සිසුන් සියලු දෙනා එක් ව ගායනය කිරීම.

පියවර 5 :
- කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබාදීම හා සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නිර්දේශිත කවි වර්ගයේ අදාළ තාලරූපය නම් කරන්න.
- නියමිත නාද මාලාව අනුගමනය කරමින් ඒකීය හඬ තලයක පිහිටා අදාළ කවි ගායනය කරන්න.
- තාල තබමින් කවි ගායනය කරන්න.
- කණ්ඩායම් වශයෙන් කවි ගායනය කරන්න.
- තනි තනි ව කැමැත්තෙන් ඉදිරිපත් වී කවි ගායනය කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.1** : ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 5.1** : ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රය හඳුනා ගනිමු. (රූකම් - ගල් කැටයම්, ලී කැටයම්, සිතුවම්, මූර්ති)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රය නම් කරයි.
- රූකම් වර්ග කර දක්වයි.
- රූකම් දක්නට ලැබෙන ස්ථාන නම් කරයි.
- නර්තනය පැවති බවට රූකම් ඇසුරින් සාධක ඉදිරිපත් කරයි.
- විවිධ වාදන භාණ්ඩ භාවිත කළ බවට තොරතුරු ඉදිරිපත් කරයි.
- රූකම් ආරක්ෂා කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : රූප සටහන්, දෘශ්‍ය සංයුක්ත තැටි, පොත්පත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** :

පියවර 1 :
- නර්තනය හා සම්බන්ධ රූකම් ඇතුළත් රූප සටහන් /දෘශ්‍ය පට ප්‍රදර්ශනය කිරීම.
- ප්‍රදර්ශනය කරන ලද රූකම් දක්නට ලැබෙන ස්ථාන පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- නර්තන කලාව හා බැඳි තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය නම් කර විස්තර කිරීම.

පියවර 2 :
- නර්තනය හා සම්බන්ධ තොරතුරු රූකම් ඇසුරෙන් සාකච්ඡා කිරීම සඳහා පොත්පත් පරිශීලනයට යොමු කිරීම.

පියවර 3 :
- ශිෂ්‍යයන් විසින් රැස් කරගන්නා ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4 :
- ඉදිරිපත් කරන තොරතුරු ඇසුරින් සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- නර්තනය හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය නම් කරන්න.
- රූකම් දක්නට ලැබෙන ස්ථාන නම් කරන්න.
- විවිධ වාදන භාණ්ඩ භාවිත කළ බවට තොරතුරු ඉදිරිපත් කරන්න.
- දැනට පවතින රූකම් ආරක්ෂා කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියාකරයි.

**නිපුණතා මට්ටම 5.2** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.2** : ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායය හැර වෙනත් නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්ම (කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව) හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි

**ඉගෙනුම් පල** :

- අදාළ ශාන්තිකර්ම පැවැත්වීමට හේතු දක්වයි.
- පුරාවෘත්ත (කථාව) විස්තර කරයි.
- පුද ලබන දෙවිවරුන්, යකුන් නම් කරයි.
- ශාන්තිකර්මයේ අන්තර්ගත නර්තන, ගායන, වාදන රංග වස්ත්‍රාභරණ, රංග භාණ්ඩ, චාරිත්‍ර විධි හා සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ශාන්තිකර්ම පැවැත්වීමේ දී සාමූහිකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳ ව අගයමින් අදහස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර, පුවත්පත්, පොත්පත් , දෘශ්‍ය සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** :

උඩරට නර්තන සම්ප්‍රදායය හදාරන සිසුන් - දෙවොල් මඩුව
පහතරට නර්තන සම්ප්‍රදායය හදාරන සිසුන් - පහන් මඩුව
සබරගමු නර්තන සම්ප්‍රදායය හදාරන සිසුන් - කොහොඹා යක් කංකාරිය

පියවර 1 :
- ශාන්තිකර්මයට අදාළ ගායන/නර්තන අංගයක් ඉදිරිපත් කරමින් හෝ ශාන්තිකර්මය හා සම්බන්ධ පින්තූර/දෘශ්‍යපට ප්‍රදර්ශනය කරමින් හෝ කුමන සම්ප්‍රදායයකට අයත් ශාන්ති කර්මයක් දැයි විමසමින් පාඩමට ප්‍රවේශ වීම.

පියවර 2 :
- කාර්ය පත්‍රිකා ලබා දී අදාළ ශාන්තිකර්මය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට යොමු කිරීම.

පියවර 3 :
- ශිෂ්‍යයන් රැස් කළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4 :
- ඉදිරිපත් කරන තොරතුරු සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කොහොඹා යක් කංකාරිය/දෙවොල් මඩුව / පහන් මඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ හේතු දක්වන්න.
- පුරාවෘත්ත (කථාව) කෙටියෙන් විස්තර කරන්න.
- ශාන්තිකර්මයේ අන්තර්ගත නර්තන, ගායන, වාදන රංග වස්ත්‍රාභරණ, රංග භාණ්ඩ, චාරිත්‍ර විධි නම් කරන්න.
- ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරුන් යකුන් නම් කරන්න.
- ශාන්ති කර්මය පැවැත්වීමේ දී සාමූහිකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳ ව ඇගයීමක් කරන්න.

  මෙම ඇගයීම් කණ්ඩායම් දෙකක් වශයෙන් ගෙන ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් ලෙස සංවිධානය කරන්න.

මේ සඳහා කෙටි ප්‍රශ්න සකස් කරගැනීම ගුරුවරයාගේ අභිමතය පරිදි සිදු කර ගත හැකිය.
සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

## කාර්ය පත්‍රිකාව

| පිරික්සුම | තොරතුරු |
|---|---|
| කොහොඹා යක් කංකාරිය/දෙවොල් මඩුව/ පහන් මඩුව පැවැත්වීමේ හේතු | 1.<br>2.<br>3. |
| පුරාවෘත්ත (කථාව) කෙටියෙන් දක්වන්න. | |
| පුද ලබන දෙවිවරු හා යක්කු | |

## කාර්ය පත්‍රිකා - 02

| පිරික්සුම | තොරතුරු |
|---|---|
| ශාන්තිකර්මයේ අන්තර්ගත ගායනය, වාදනය නර්තන අංග නම් කරන්න. | |
| රංග වස්ත්‍රාභරණ, රංග භාණ්ඩ හා චාරිත්‍ර විධි නම් කරන්න. | |
| ශාන්තිකර්ම පැවැත්වීමේ දී සාමූහික ව කටයුතු කිරීමේ වටිනාකම පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න. | |

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.3** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.3** : නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- එස්.පණීභාරත (උඩරට), කේ.එස්.ප්‍රනාන්දු (පහතරට) ගලුකාගම හීන් නිලමේ (සබරගමු) යන ශිල්පීන්ගේ ජීවන තොරතුරු විස්තර කරයි.
- සාම්ප්‍රදායික නර්තන ප්‍රවර්ධනයට සිදු වූ සේවාව විස්තර කරයි.
- එම ශිල්පීන් විසින් දක්වන ලද ශිල්පීය කුසලතා අගයමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : ඡායාරූප, පොත්පත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නර්තන ශිල්පීන් තිදෙනාගේ පින්තූර කළු ලෑල්ලේ ප්‍රදර්ශනය කිරීම.

පියවර 1 ප්‍රදර්ශනය කරන ලද පින්තූර ඇසුරෙන් ශිල්පීන්ගේ නම් හා අදාළ සම්ප්‍රදාය විමසමින් සාකච්ඡා කිරීම.

පියවර 2 පොත්පත් භාවිත කරමින් නර්තන ශිල්පීන් පිළිබඳ තොරතුරු කණ්ඩායම් වශයෙන් අධ්‍යයනය කිරීමට යොමු කිරීම.

- ජීවන තොරතුරු
- නර්තන කලාවට සිදු කළ සේවය
- සුවිශේෂ කුසලතා

පියවර 3 රැස් කරගන්නා ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4 සිසුන් විසින් රැස් කරන ලද තොරතුරු ඇසුරෙන් සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නිර්දේශිත නර්තන ශිල්පීන් සම්ප්‍රදායයන් අනුව නම් කරන්න.
- ඔවුන්ගේ ජීවන තොරතුරු කෙටියෙන් දක්වන්න.
- සාම්ප්‍රදායික නර්තන ප්‍රවර්ධනයට සිදුවූ සේවාව හා ශිල්පීය කුසලතා අගයමින් පුවත්පතට ලිපියක් සකස් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.1** : පෙරහැර හා සබැඳි පසුබිම අධ්‍යයනය කරමින් සුවිශේෂ ලක්ෂණ විචාරය කරයි.

**ක්‍රියාකාරකම 6.1** : මහනුවර දළදා පෙරහැර හා එහි අසිරිය අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- පෙරහැර හා සබැඳි පසුබිම විස්තර කරයි.
- පෙරහැර පැවැත්වීමේ හේතු ඉදිරිපත් කරයි.
- පෙරහැර හා සබැඳි නර්තනය, ගායනය, වාදනය, සැරසිලි සහ රංග වස්ත්‍රාභරණවල කලාත්මක ලක්ෂණ සාකච්ඡා කරයි.
- පෙරහැර පැවැත්වීමේ කාල සීමාව දක්වන්න.
- පෙරහැරෙහි ආගමික හා සංස්කෘතික වටිනාකම් අගයමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර, ඡායාරූප, දෘශ්‍ය සංයුක්ත තැටි, පුවත්පත්, සඟරා, කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- මහනුවර දළදා පෙරහැර පිළිබඳ තොරතුරු රැගෙන ඒමට සිසුන් දැනුම්වත් කරන්න.

පියවර 1

- ශිෂ්‍යයන් විසින් රැගෙන එන ලද තොරතුරු විමසමින් මහනුවර දළදා පෙරහැර පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවීම.
    - පැවැත්වීමේ හේතු
    - ඓතිහාසික පසුබිම
    - පෙරහැර පැවැත්වීමේ කාලසීමාව
    - පෙරහැර හා බැඳි චාරිත්‍ර
    - නර්තන, ගායන,වාදන, සැරසිලි රංග වස්ත්‍රාභරණ
    - ආගමික හා සංස්කෘතික වටිනාකම

**පියවර 2** :

- නර්තනය, ගායනය,වාදනය, සැරසිලි රංග වස්ත්‍රාභරණ ඉගෙනුම් ආධාරක ඇසුරෙන් කරුණු තහවුරු කර ගැනීමට මඟ පෙන්වීම.

**පියවර 3** :

- සිසුන් කණ්ඩායම් කර අදාළ කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කිරීමට යොමු කරවීම.

**පියවර 4**

- සිසුන් විසින් සපයන ලද පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

**පියවර 5**

- ඉදිරිපත් කරන ලද තොරතුරු අගයමින් සමාලෝචනයක යෙදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- පෙරහැර හා සබැඳි ඓතිහාසික පසුබිම කෙටියෙන් දක්වන්න.
- මහනුවර දළදා පෙරහැර පැවැත්වීමේ හේතු දෙකක් නම් කරන්න.
- පෙරහැරෙහි දැකිය හැකි නර්තන, ගායන, වාදන අංගවලට අමතරව එහි පවත්නා වෙනත් විශේෂ අංග තුනක් නම් කරන්න.
- මහනුවර දළදා පෙරහැරෙහි ආගමික හා සංස්කෘතික වටිනාකම මාතෘකා කොටගෙන බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 01**

1. මහනුවර දළදා පෙරහැර පැවැත්වීමේ හේතු නම් කරන්න.
2. පෙරහැර හා සබැඳි ඓතිහාසික පසුබිම කෙටියෙන් දක්වන්න.

**කාර්ය පත්‍රිකා අංක 02**

1. පෙරහැර පැවැත්වෙන කාල සීමාව නම් කරන්න.
2. පෙරහැර හා සබැඳි චාරිත්‍ර කෙටියෙන් විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 03**

1. මහනුවර දළදා පෙරහැරෙහි දැකිය හැකි නර්තන, ගායන හා වාදන අංග දෙක බැගින් නම් කරන්න.
2. පෙරහැරෙහි විචිත්‍රත්වය සඳහා සැරසිලි හා රංග වස්ත්‍රාභරණ දායක වන ආකාරය විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 04**

1. නර්තනය, ගායනය, වාදනය යන අංගවලින් බැහැර ව දළදා පෙරහැරෙහි දැකිය හැකි වෙනත් විශේෂාංග නම් කරන්න.
2. මහනුවර දළදා පෙරහැරෙහි ආගමික හා සංස්කෘතික වටිනාකම් පිළිබඳ ව ඇගයීමක් කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.2** : වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.2** : භරත නාට්‍යම් හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 6.2.1** :

- භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.
- ආගමික පසුබිම පිළිබඳ ව තොරතුරු විස්තර කරයි.
- සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව විස්තර කරයි.
- නර්තනය උගන්වනු ලබන ආයතන හා ප්‍රවර්ධනයට දායක වූවන් නම් කරයි.
- නර්තන අංග සහ රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර, දෘශ්‍ය සංයුක්ත තැටි, ලිපි, සඟරා, කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** :

- පහත සඳහන් මාතෘකාවලට අදාළ ව ඇමුණුමක් සකස්කර ගන්න. එක් කණ්ඩායමකට ඇමුණුම හා එක් මාතෘකාව බැගින් ලබා දෙන්න

- භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශ
- භරත නාට්‍යම් හා බැඳි ආගමික පසුබිම
- සංගීත සම්ප්‍රදායය හා වාද්‍ය භාණ්ඩ
- උගන්වනු ලබන ආයතන
- නර්තන අංග හා රංග වස්ත්‍රාභරණ
- ප්‍රවර්ධනයට දායක වූවන්

පියවර 1 :

- භරත නාට්‍යම් නර්තන අංගවල පින්තූර හෝ දෘශ්‍ය සංයුක්ත තැටි ප්‍රදර්ශනය කර, එම සම්ප්‍රදායෙහි රංග වස්ත්‍රාභරණ, වාද්‍ය භාණ්ඩ, මුද්‍රා භාවිතය ආදිය හඳුනාගැනීමට සැලැස්වීම හා ඒ පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :

- භරත නාට්‍යම් සම්ප්‍රදායය පිළිබඳ ව තොරතුරු ඇතුළත් ඇමුණුමක් ලබා දී කණ්ඩායම් වශයෙන් තොරතුරු අධ්‍යයනයට යොමු කරවීම.

පියවර 3

- අදාළ තොරතුරු ඉදිරිපත් කරවීමට අවස්ථාව ලබාදීම.

පියවර 4

- ඉදිරිපත් කරන ලද තොරතුරු ඇසුරෙන් කුඩා පොත් පිංචක් නිර්මාණයට යොමු කරවීම.

පියවර 5

- සමස්ත තොරතුරු අගයමින් සමාලෝචනයක යෙදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : පහත සඳහන් ප්‍රශ්නාවලිය වාචික ව විමසමින් ශිෂ්‍යයන් විසින් සකස් කරන ලද කුඩා පොත පිළිබඳ ඇගයීමක් කරන්න.

- භරත නාට්‍යම් සම්ප්‍රදායය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
- භරත නාට්‍යම් සම්ප්‍රදායය හා බැඳි ආගමික පසුබිම විස්තර කරන්න.
- මෙම සම්ප්‍රදායයේ සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නම් කරන්න.
- අරංගේත්‍රම් සන්දර්ශනයක අනුපිළිවෙළ ලියන්න.
- භරත නාට්‍යම් සම්ප්‍රදායයෙහි භාවිත රංග වස්ත්‍රාභරණ කට්ටලයක කොටස් හතරක් නම් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

කාර්ය පත්‍රිකා 01
1 භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.
2 ආගමික පසුබිම පිළිබඳ තොරතුරු විස්තර කරයි.

කාර්ය පත්‍රිකා 02
1 සංගීත සම්ප්‍රදායය හා වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කරන්න.
2 නර්තනය උගන්වන ආයතන හා ඒවායේ ප්‍රවර්ධනයට දායක වූවන් නම් කරන්න.

කාර්ය පත්‍රිකා 03
1 අරංගේත්‍රම් සන්දර්ශනයක අනුපිළිවෙළ ලියන්න.
2 භරත නාට්‍යම්හි භාවිත රංග වස්ත්‍රාභරණ කට්ටලයක කොටස් හතරක් නම් කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.3** : විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.3** : නවරාත්‍රි උත්සවය හඳුනාගනිමු.

**කාලච්ජේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නවරාත්‍රි උත්සවය හා සබැඳි ආගමික පසුබිම විස්තර කරයි.
- පැවැත්වීමට හේතු නම් කරයි.
- උත්සවය හා සබැඳි නර්තන, ගායන, වාදන සහ සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සංස්කෘතික වටිනාකම් අගයමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : නවරාත්‍රි උත්සවය හා බැඳි පින්තූර,දෘශ්‍ය සංයුක්ත තැටි, පුවත්පත්, සඟරා, ඇමුණුම

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 1 :
- විවිධ ආගමික උත්සව පිළිබඳ ව සිසු දැනුම විමසමින් හින්දු ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රි උත්සවයේ,
    - ආගමික පසුබිම
    - පැවැත්වීමේ හේතු
    - නර්තන, ගායන, වාදන, සැරසිලි
    - සංස්කෘතික වටිනාකම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :
- ඉගෙනුම් ආධාරක ඇසුරෙන් නවරාත්‍රි උත්සවයේ දක්නට ලැබෙන නර්තන, ගායන, වාදන සැරසිලි ඇසුරෙන් සාකච්ඡා කරන ලද තොරතුරු තහවුරු කර ගැනීමට මඟපෙන්වීම.

පියවර 3 :
- පළමු පියවරෙහි සඳහන් කරුණු ඇතුළත් වන සේ පැවරුම් සම්පූර්ණ කර පිළිතුරු සැපයීමට යොමු කිරීම.

පියවර 4 :
- ශිෂ්‍යයයන් විසින් සපයන ලද පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 5 :
- ඉදිරිපත් කරන ලද තොරතුරු අගයමින් සමාලෝචනයක යෙදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- "නවරාත්‍රි " යන්නෙහි අරුත දක්වන්න.
- පැවැත්වීමේ හේතු නම් කරන්න.
- ආගමික පසුබිම විස්තර කරන්න
- නවරාත්‍රියෙහි දැකිය හැකි නර්තන, ගායන, වාදන හා සැරසිලි පිළිබඳ ව අදහස් දක්වන්න.
- ආගමික උත්සවයක් ලෙස මෙහි සංස්කෘතික වටිනාකම් ඇගයීමට ලක් කරන්න.
- පිටු පෙරළනයක් මඟින් නවරාත්‍රී උත්සවය හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.1** : නිර්දේශිත ගීතයකට සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 7.1** : ගීතයේ පසුබිම හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ගීත පද රචනය, සංගීතඥ, ගායන ශිල්පීන් නම් කරයි.
- පද රචනයේ දී භාෂාව හසුරුවාගෙන ඇති අයුරු විස්තර කරයි.
- ගීතයේ කලාත්මක පසුබිම පිළිබඳ අදහස් දක්වයි.
- ගීතයේ අර්ථය විග්‍රහ කරමින් අදහස් ඉදිරිපත් කරයි.
- ගීතය ශ්‍රවණය කරමින් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- කැසට් පට/සංයුක්ත තැටි, ගීතය ලියන ලද සටහන්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 1 :

- දීකිරි, දීකිරි/රත්නදීප ජන්ම භූමි යන ගීත ශ්‍රවණය කිරීමට සැලැස්වීම.

පියවර 2 :

- ගීතයේ පසුබිමට අදාළ ව පහත සඳහන් කරුණු ඔස්සේ කාඩ්පත් සකස් කරගන්න. (කාඩ්පත් සකස් කිරීමේ දී පහත උදාහරණය සැලකිල්ලට ගන්න.)
  - පද රචනය, සංගීත නිර්මාණය, ගායනය
  - ගීතයේ අර්ථය, දීකිරි ගීතය මුලින් ම ගායනය කළ අය, අයත් නාට්‍යය

උදා: 

| දීකිරි, දීකිරි ගීතය ගායනය කරන ලද්දේ කවුරුන් විසින් ද ? |
|---|

| අනුලා බුලත්සිංහල |
|---|

| රත්නදීප ජන්ම භූමි ගීතය ගායනය කරන ලද්දේ කවුරුන් විසින් ද ? |
|---|

| පණ්ඩිත් අමරදේව |
|---|

පියවර 3 : 
- සකස් කර ගන්නා ලද පිළිතුරු ඇතුළත් කාඩ්පත් මේසයක් මත තැබීම.
- ගීතයේ පසුබිමට අදාළ ප්‍රශ්න ඇතුළත් කාඩ්පත් එකින් එක ප්‍රදර්ශනය කිරීම.
- ප්‍රශ්නයට අදාළ පිළිතුර තෝරාගෙන ප්‍රශ්නය ඉදිරියෙන් රැඳවීමට සිසුන් යොමු කිරීම.
  (මේ අයුරින් සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරන්න)

පියවර 4 : 
- ගීතය ගායනය කිරීමට සැලැස්වීම.

පියවර 5 : 
- ඉදිරිපත් කරන ලද තොරතුරු ඇසුරින් ගීතයේ පසුබිම පිළිබඳ සමාලෝචනයක් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : 
- දීකිරි දීකිරි /රත්නදීප ජන්මභූමි යන ගීතවල පද රචකයන් නම් කරන්න.
- පද රචනයේ දී භාෂාව හසුරුවාගෙන ඇති අයුරු විස්තර කරන්න.
- ගීතයේ අර්ථය කෙටියෙන් විස්තර කරන්න.
- ගීතයක කොටසක් ගායනය කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.2** : ගීතයකට අනුව නර්තන නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 7.2** : ගීතයට අනුව නර්තනය නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- ගීතයට උචිත චලන යොදා ගනිමින් නර්තන නිර්මාණය කරයි.
- ඒකල හා සාමූහික වශයෙන් නර්තන නිර්මාණය කරයි.
- අවශ්‍යතා නිසි ලෙස යොදා ගනිමින් නිමාවක් සහිත නර්තන ඉදිරිපත් කරයි.
- ඉදිරිපත් කරන ලද නර්තන අංග පිළිබඳ ව අගයමින් අදහස් ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : කැසට් පට/ සංයුක්ත තැටි,

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :** :

පියවර 1 :
- දීකිරි දීකිරි /රත්නදීප ජන්මභූමි ගීත ගායනය කර එහි විශේෂතා සාකච්ඡා කිරීම.

පියවර 2 :
- නර්තන නිර්මාණයේ දී අනුගමනය කළ යුතු කරුණු සාකච්ඡා කිරීම (තාලානුකූල, රිද්මයානුකූල, ප්‍රකාශණාත්මක, චලන හා අවකාශ භාවිතය පිළිබඳ ව)

පියවර 3 :
- කණ්ඩායම් වශයෙන් ගීතයට අනුව නර්තන නිර්මාණයට යොමු කිරීම

පියවර 4
- සිසුන් නිර්මාණය කරන ලද නර්තන ඉදිරිපත් කිරීමට අවකාශය සැලැස්වීම.

පියවර 5 :
- ඉදිරිපත් කරන ලද නර්තන නිර්මාණ පිළිබඳ අන් අයගේ අදහස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් සූදානම් කරවන්න.

- ගීතයේ කොටසක් ගායනය කරන්න.
- කණ්ඩායම් වශයෙන් ගීතයට අනුව නර්තනය ඉදිරිපත් කරන්න.
- නර්තන නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු හතරක් ලියා දක්වන්න.
- ඉදිරිපත් කරන ලද නර්තනාංග පිළිබඳ ව ඇගයීමක් කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.3** : සරල සැරසිලි අංගයක් නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 7.3** : ගොප් ගෙඩියක් නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- ගොප් ගෙඩියක් භාවිතයට ගන්නා අවස්ථා නම් කරයි.
- සැරසිල්ල සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය නම් කරයි.
- සැරසිලි අංගය නිර්මාණය සඳහා නිවැරදි ශිල්ප ක්‍රම භාවිතයට ගනියි.
- ගොප් ගෙඩියකට උචිත ගොක් කොළ කැටයම් නිර්මාණය කරයි.
- නිමාවක් සහිත ගොප් ගෙඩියක් නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද ගොප් ගෙඩිය පිළිබඳ ව අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර අමුද්‍රව්‍ය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් : :**

පියවර 1 :
- නිර්මාණය කරන ගොප් ගෙඩියක ආකෘතියක් හෝ පින්තූරයක් ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම.

පියවර 2 :
- ගොප් ගෙඩියක් නිර්මාණය කරන විධික්‍රම පෙන්වා දීම.

පියවර 3 :
- විධික්‍රම භාවිත කරමින් සරල කැටයමක් නිර්මාණය කර පෙන්වීම හෝ හැකියා ඇති සිසුන් ඇත් නම් ඔවුන් ලවා නිර්මාණය කර පෙන්වීම.

පියවර 4 :
- සමූහ වශයෙන් ගොප් ගෙඩි නිර්මාණය කිරීමට යොමු කිරීම.

පියවර 5 :
- නිර්මාණය කරන ලද ගොප් ගෙඩි පන්තියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 6 :
- ප්‍රදර්ශනය කරන ලද නිර්මාණ පිළිබඳ අන් අදහස් විමසමින් සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : පහත සඳහන් ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීම සඳහා සිසුන් සූදානම් කරන්න.

- ගොප් ගෙඩිය නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් ලබා ගත හැකි අමුද්‍රව්‍ය තුනක් ලියන්න.
- සරල ගොප් කොළ කැටයමක් නිර්මාණය කරන්න.
- ගොප් ගෙඩිය භාවිත කරන අවස්ථා පිළිබඳ ව අදහස් දන්වන්න.
- නිමාවක් සහිත ගොප් ගෙඩියක් නිර්මාණය කරන්න.

සැ.යු. සුදුසු නිර්ණායක අනුව ඇගයීම කරන්න.